# THE WHITE HACKLE

*Pioneer Sri Lanka Army Quarterly and the Journal of the Sri Lanka Light Infantry*

THE WHITE HACKLE
85 ISSUE
JULY - SEPTEMBER

# වයිට් හැකල්

ශ්‍රී ලංකා පාබල හමුදා සඟරාව
இலங்கை காலாட் படை சஞ்சிகை
JOURNAL OF THE SRI LANKA LIGHT INFANTRY



*Newly Opened*

## CORPORAL CLUB

Sri Lanka Light Infantry Regiment

www.army.lk/lightinfantry Search...
editor.whitehackle@gmail.com

## සුබ මොහොතින් නව තනතුරට පත් වූ ඔබට

# රෙජිමේන්තු අධිපති ඇතුලු සියලුම නිලයින්ගේ උණුසුම් සුබ පැතුම්...



අණාදෙන නිලධාරි 5(සේවි) ශ්‍රීලපාහ
නි/4787 මේජර්
ටීඑම්ආර්කේ තෙන්නකෝන් ශ්‍රීලපාහ



දෙවන අණාදෙන නිලධාරි
රෙජිමුඛ ශ්‍රීලපාහ
නි/64416 මේජර්
ආර්එම්එස් රාජකරුණා ශ්‍රීලපාහ



ක්‍රියාන්විත හා පුහුණු භාර නිලධාරි
1 ශ්‍රීලපාහ
නි/64551 මේජර්
බීජීඒ රූපසිංහ ශ්‍රීලපාහ



රෙජිමේන්තු සැරයන් මේජර්
24 ශ්‍රීලපාහ
සෙ/309514 ඔනි 1 බීබීජේ දේශප්‍රිය



රෙජිමේන්තු සැරයන් මේජර්
8 ශ්‍රීලපාහ
සෙ/309576 ඔනි 1 එම්පීජී සෝමරත්න



උපකරණ පාලක
සැරයන් මේජර් 1 ශ්‍රීලපාහ
සෙ/301245 ඔනි II බණ්ඩාර පීඒජීආර්



රෙජිමේන්තු උපකරණ පාලන
සැරයන් මේජර් 24 ශ්‍රීලපාහ
සෙ/312259 ඔනි II පියසේන පීඑන්



රෙජිමේන්තු උපකරණ පාලක
සැරයන් මේජර් 9(සේවි) ශ්‍රීලපාහ
සෙ/9ඩී00338 ඔනි 11 සමරවික්‍රම අයිඑන්



රෙජිමේන්තු උපකරණ පාලක
සැරයන් මේජර් 7 ශ්‍රීලපාහ
සෙ/307928 ඔනි 11 ධර්මසිරි ඒආර්



ප්‍රධාන ලිපිකරු 10 ශ්‍රීලපාහ
සෙ/317376 සැරයන්
රත්නායක ආර්එම්ජේබී



ප්‍රධාන ලිපිකරු 1 ශ්‍රීලපාහ
සෙ/316037 සැරයන් සමන් කුමාර එන්එල්ඩබ්

# වයිට් හැකල් White Hackle

85th Issue - July - September 2015


## පටුන | පිටුව


| පටුන | පිටුව |
|---|---|
| අදහස් උදහස් හා විවේචන | 02 |
| මැරී මැරුණු මිනිස්සු කෙටි කථාවේ අවසාන කොටස | 03 ~ 04 |
| අන්තර් ඒකක මලල ක්‍රීඩා තරගාවලිය | 05 |
| පාබල හමුදා සංගමයේ 2015 නිලවරණය | 06 |
| 9 ශ්‍රීලපාහ පුවත් | 07 |
| 8 ශ්‍රීලපාහ පුවත් | 08 |
| අන්තර් රෙජිමේන්තු සරඹ තරගාවලිය | 09 |
| 10, 20 ශ්‍රීලපාහ ඒකක පුවත් | 10 |
| 11 ශ්‍රීලපාහ පුවත් | 11 |
| සේවාවනිතා පුවත් | 12 ~ 13 |
| 1, 17 ශ්‍රීලපාහ ඒකක පුවත් | 14 |
| 24 ශ්‍රීලපාහ පුවත් | 15 |
| සිතක සේයා විශේෂාංග | 16 |
| 4 ශ්‍රීලපාහ පුවත් | 17 |
| 15 ශ්‍රීලපාහ පුවත් | 18 |
| රෙජි අධිපතිතුමන්ගේ 15 ශ්‍රීලපාහ සංචාරය | 19 |
| කෝප්‍රල් සමාජ ශාලාව විවෘත කිරීම | 20 ~ 21 |
| අන්තර රෙජිමේන්තු පැරා තරගාවලිය 2015 | 22 |
| 23 ශ්‍රීලපාහ පුවත් | 23 |
| මුළුතැන්ගෙය සංකීර්ණය විවෘත කිරීම | 24 |
| ශ්‍රම දායකත්වය ඇගයීම | 25 ~ 26 |
| විශේෂාංග ලිපිය | 27 |
| උපන්දින සුභපැතුම් | 28 |
| දසුනේ හසුන විශේෂාංගය | 29 |
| 18 ශ්‍රීලපාහ පුවත් | 30 |
| විශේෂංග ලිපිය | 31 |
| මේරියන්ස් සංගීත ප්‍රසංගය | 32 |
| 2 ශ්‍රීලපාහ පුවත් | 33 |
| 20 ශ්‍රීලපාහ පුවත් | 34 |
| 25 ශ්‍රීලපාහ පුවත් | 35 |
| විශේෂාංග ලිපිය | 36 ~ 37 |
| 7 ශ්‍රීලපාහ පුවත් | 38 |
| ප්‍රහේලිකාව | 39 ~ 40 |














## කවරයේ කථාව

ශ්‍රී ලංකා පාබල හමුදා රෙජිමේන්තු කොනොනි සමාජ ශාලාව අති නවීණ අංගෝපාංගයන් සහිතව 2015 අගෝස්තු මස 22 වන දින යුද්ධ හමුදාධිපති තුමන් සුරතින් විවෘත විය. මෙම අවස්ථාවට රෙජිමේන්තු අධිපති තුමන් සහ මධ්‍යස්ථාන සේනාවිධායක තුමන් සහභාගී වූ අතර, එම උත්කර්ෂවත් අවස්ථාවේ ඡායාරූප සමගින් මෙවර කලාපයේ මුල් පිටුව වර්ණවත් වේ.


Printed by

වයිට් හැකල් මුද්‍රණාලය

Sri Lanka Light Infantry
Army Cantonment
Panagoda, Homagama.



T:P: - 0112098133
Ext - 57660
Fax - 0112855204
E-mail - whitehacklesli@gmail.com

# THE WHITE HACKLE

85th Issue - July-September 2015

## SRI LANKA LIGHT INFANTRY QUARTERLY

**COLONEL OF THE REGIMENT**

Maj Gen KADA Karunasekara RSP VSV USP ndu psc

**CENTRE COMMANDANT**

Brig MM Kithsiri RSP

**DEPUTY CENTRE COMMANDANT RHQ SLLI**

Col GMN Perera RWP RSP

**ADJUTANT RHQ SLLI**

Maj KY Priyadarshana RSP psc SLLI

**THE WHITE HACKLE EDITORS**

**Chief Consultant**

Maj Gen KADA Karunasekara RSP VSV USP ndu psc

**Editor in Chief**

Brig MM Kithsiri RSP

**Assistant Editors**

Maj KY Priyadarshana RSP psc SLLI

( Adjutant RHQ SLLI )

Maj AD Gunarathne RSP SLLI

(Officer In Charge )

Maj TMAN Thennakoon RWP SLLI

(Press Officer In Charge)

**Honourary Consultants**

GenRMDRathnayake(Retd)WWV RWP RSP VSV USP ndu psc

(Reg Force)

Lt Gen HV Atukorale (Retd) VSV psc FBIM

(Reg Force)

Brig AER Abeyesinghe (Retd) KSV

(Vol Force)

**Computer Type Setting & Designed**

L/Cpl Suranga RBP - White Hackle Publication (25 SLLI)

**WHITE HACKLE PUBLICATION**

| | | |
|---|---|---|
| Publisher | - | Regimental Centre<br>Sri Lanka Light Infantry |
| Telephone | - | 0112855204 / 0112855357 - 59 |
| Ext | - | 57656 |
| Fax | - | 0112855204 |
| E-mail | - | editor.whitehackle@gmail.com<br>editor.whitehackle@yahoo.com |
| Website | - | www.army/lightinfantry.lk |


# FEEDBACK

## අදහස්, උදහස් හා විවේචන

## Readers Please Write in

The **WHITE HACKLE** the Voice of Sri Lanka Light Infantry Regiment is now firmly established. It has reached maturity. This is the 85th issue. This quarterly is for members of the SLLI, their families, Ex-Servicemen of SLLI, and as a whole for the entire Army. It will be extended even to all Sri Lankans.

We should not rest on our laurels. Targets have to be set. Greater goals to be achieved. The success of **WHITE HACKLE** depends on combined efforts. Everyone has his contribution to make, and every contribution is most welcome in any language (Sinhalese, Tamil and English). What is valued is our making the attempt, and then we can surely do our bit. Express your thoughts, ideas, opinions, and criticisms, hopes and fears through **" THE WHITE HACKLE "**, the journal of the oldest and proudest Regiment of them all. If you have much to say about your Battalion's experience, go ahead and write in to **" THE WHITE HACKLE "** we are willing to accept and publish. We are happy to hear you and consider your contribution in any form; sketches, cartoons, stories, poems and whatever comes from your thoughts and your pen.

Our Motto is **" Ich Dien", " I Serve"**. Let **'White Hackle'** be a way to serve each other, our Regiment and our country with our banner flying high as it always will. Wishing you all the very best.

-Editor-

## කතුවැකිය

"සේවය කරමි" යන්න අපගේ ආදර්ශ පාඨයයි. එම ආදර්ශ පාඨය යටතේ අතීතයේ සිටි පාබල විරුවන් ලක් බිමට තම ඥාණ දානය, කාය දානය හා ප්‍රාණ දානය පුද කර ඇත. වත්මන් අප පාබල විරුවන් ද එම ගමන් මගෙහිම ගමන් කරමින් සිටී. අතීතය, වාර්තමානය තුලින් අනාගතය සැකසෙන බව පරම සතයයකි. රට දැයට සේවය කරන්නට බැඳි සිටනවුන්ට නිදහසේ සේවය කරන්නට සුදුසු පරිසරයක් "පාබල නිවහන" තුල තිබිය යුතු බව පසක් කරමින් පාබල හමුදා පරිශ්‍රය නවීකරණය වෙමින් පවතී. එහි එක් පියවරක් ලෙස පසුගිය දිනක මනරම් පරිසරයක නවීන පහසුකම් වලින් සුසැදි රෙජිමේන්තු කොනොනි සමාජ ශාලාව වත්මන් යුද හමුදාධිපති තුමන්ගේ සුරතින් විවෘත විය. එපමණක් නොව අති නවීන උපකරණ වලින් සැදුම්ලත් රෙජිමේන්තු මුළුතැන් ගෙය ද සේවාවන් සඳහා එක් කර ඇත. ඉදිරියේදී රෙජිමේන්තු නිලධාරී නිවස්නය ද විවෘත වීමට නියමිත අතර, ආගම දහමට මුල් තැන සෙමින් ඉදිවෙමින් පවතින පන්සල ද අප පාබල නිවහයේ ප්‍රෞඩත්වය දෙගුණ තෙගුණ කරයි. අතීතය, වර්තමානය තුළින් අනාගතයට නැවුම් දේ එක්කරන්නා සේම අනාගත පාබල පරපුර වෙනුවෙන් රැක ගැනීම අප සැමගේ පරම යුතුකම වේ.


The White Hackle is published quarterly under the supervision of the Regimental Centre Commandant to educate the Sri Lanka Light Infantry Officers and men on various topics including news, information on activities, people, policies, operations, technical developments, views, opinions and ideas to satisfy their reading thirst. Manuscripts of interest to the Regiment are invited. Direct Communication is authorized. The White Hackle, Regimental Centre, Army Cantonment, Panagoda, Homagama. Phone 0112855204 or 0112855356-60 Extn. 57656. Individual paid subscriptions are available through the Regimental Adjutant, Sri Lanka Light Infantry. Publication of this periodical is authorized by the Dte, of PA Army HQ CBO by letter No. A/275/27 of 16 Mar, 94. Use of funds for printing of this Publication has been approved by the Regimental Commander on 30th Aug 1993 at

කෙටි කතාව



# මැරිමැරුණු මිනිස්සු

රචනය :
මේජර් ඒඩී ගුණරත්න ආර්එස්පී

දින සති ගෙවී ගොස් තිබුණි. සුමිත් සහ සරත් හසලක සිට මහනුවරට පැමිණ යුද හමුදා සම්මුඛ පරීක්‍ෂණායට සහභාගිවී නිවෙසට පැමිණෙන ලදි. ටිකක් හවස් වන විට නිවසට ළඟාවූ ඔවුන් ඊළඟ සම්මුඛ පරීක්‍ෂණ දිනය පසුව දන්වනවා යැයි ප්‍රකාශ කළ බැව් මවට දැනුම් දෙන ලදි. දෙදෙනා පිළිබඳව සම්මුඛ පරීක්‍ෂණ මණ්ඩලයේ සිටි නිලධාරීන් ඉතාමත් සතුටු වූ බව දෙදෙනා විසින් මවට දන්වා සිටින ලදි. ''අම්මේ එතැන හිටපු උසස් නිලධාරියෙක් කිව්වා හසලක කොහොමටත් හොඳ කොල්ලෝ ඉන්නවා කියලා, ඇයි අයියේ අයියයි මල්ලියි දෙන්නම ආවාම ගෙදර තව කවුද ඉන්නේ ඇහුවා. මම අම්මා විතරයි කිවාම කීවා ''අද කාලේ තමන්ගේ පුත්තු යුද්දෙට එවන්නෙ නැතුව හංගාගෙන ඉන්න අම්මලාට මේ අම්මා දෙන්නේ හොඳ පණිවිඩයක් කීවා, යැයි සුමිත් විසින් ද ප්‍රකාශ කරන ලදි. මේ සියලු ආගිය ගමන් විස්තර අසා සිටි මවට තමන්ගේ දරුවන් දෙදෙනා පිළිබඳව ඇති වූයේ කියන්නට බැරි තරම් ආදරයක් හා අභිමානයකි.

ඊළඟ සතියේ ඔවුන් හට ඊළග කැඳවීම් ලිපිය ලැබුණේ වෛද්‍ය පරීක්‍ෂණය සඳහායි. ඒ සඳහා ගිය ඔවුන් හට එය අවසානයේ සියලු බඩුභාහිරාදිය සමග පැමිණීමට දින සටහන් කල ලිපියක් සහ එනවිට රැගෙන ආයුතු බඩු ලැයිස්තුවද ලැබුණි. එම ලිපි ලැබීමෙන් වඩාත් උද්දාමයට පත් සරත් තම සොයුරා පිළිබඳව සොයාබැලීමට ඔහු සිටි ස්ථානයට ගියද ඔහු පෙනෙන්නට නැතිවූ නමුත් ඔහුද මහත් සතුටින් පැමිණෙන ලදි. ඔහුද සතුටින් සිටි අතර එම ලිපිය හා බඩු ලැයිස්තුව ඔහු අතවිය. ඔවුන් නිවසට සතුටින් පැමිණියද ඔවුන් ටික ටික නිවසින් බැහැර වන දිනය ලගාවන දුකින් මව සිටින බව ඔවුන්ට තේරුණි. මහලොකු ඉතිරි කල මුදලක් ඔවුන් ලග නොතිබූ නිසා සරත් හා සමිත්ගේ මව ඇයගේ සොයුරා වෙතින් යම්කිසි මුදලක් ඉල්ලා අවසානයේදී යුධ හමුදා පුහුණුවට ඇවැසි කාලමණා සකස් කර දීමට ඉදිරිපත් විය.

සරත් හා සුමිත් මාස 06 ක පමණ පුහුණුවක් සඳහා අම්පාර යුධ හමුදා පුහුණු පාසලට ඇතුලත් කර තිබුණි.මව නිතර දුකින් සටීම නිසා රෝගාතුර විය. එහෙත් ඒ කිසිවක් ඉදහිට හෝ යවන ලිපියක නොලිවීමට ඇය වගබලා ගත්තාය. ඒ මන්ද ඒ නිසා දරුවන් දෙදෙනාගේ සිත් දුර්වල වේයැයි යන හේතුව නිසාවෙනි. අම්පාර පුහුණු පාසලේ පුහුණුව ඉතාමත් සාර්ථකව නිමකරන්නට සොයුරෝ දෙදෙනාටම හැකියාව ලැබුණු අතර පුහුණු පාඨමාලාවේ දක්‍ෂතම සෙබලාවීමේ වරම සරත් විසින් ලබාගෙන තිබුණි. ඔහුට එම කුසලානය ලබාදෙන මොහොතේ ඇතිවුන සතුට දරාගන්නට මවට හැකියාවක් නොතිබූ බව ඇගේ ඇස් සාක්‍ෂි දරා තිබිණි. අවසානයේ තම මව හා එක්ව ඡායාරූපයකට පෙනී සටින්නට සොයුරෝ අමතක කලේ නැත. එකට යුධ සෙබලුන් සේ යුධ හමුදාවට බැදුනු සොයුරන් දෙදෙනා එකම පාබල රෙජිමේන්තුවක ඒකක දෙකක් වෙත අනියුක්ත කර තිබුණි. දින 10 ක නිවාඩුවකින් පසු සරත් සහ සුමිත් යාපනය ප්‍රදේශයේ රාජකාරි සඳහා රත්මලාන කඳවුර වෙත රපෝර්තු කරවන ලදි. දෛවයේ හාස්කමක අරුමය නම් සරත් සමගින් යාපනය වෙත යාම සඳහා තම ඒකක සෙබලුන් සමගින් සුමිත්ද පැමිණ සිටින ලදි. එකම ගුවන් යානයකින් එදින මලහිරු බැස යන හෝරාවකදී ඔවුන් දෙදෙනා ගුවන්ගත වන ලදි. ඔවුනොවුන් නිදි මෙන් සිටි අතර ගුවන් යානය දෙපසින් විශාල හඩක් සමගින් ගිනිබෝල විසිවනු දැක ඔවුන් ප්‍රකෘති තත්වයට පැමිණෙන ලදි. එහෙත් ඒ ගුවන් යානා ආරක්‍ෂාව සඳහා නිකුත් කල මිසයිල බව පසුව ඔවුන් දැන ගන්නා ලදි.

1999 වසරේ මේ වකවානුව වන විට යුද්ධය තදින්ම ඇවිලී ගොස් තිබූ අතර සරත් හා සුමිත්ටද නොදැනීම ඔවුන්ගේ යුධ හමුදා දිවියේ තෙවැනි වසරද නිමා වෙමින් තිබුණි. සරත් අනුයුක්තව සිටි පාබල ඒකකය යාපනය මුහුදු සීමාවේ නගර්කෝවිල් නම් වූ ප්‍රදේශය විය. නිතර නිතර මේ ප්‍රදේශයට ගොඩබිම සතුරන්ගෙන් මෙන්ම මුහුදු කොටින් වෙතින් ප්‍රහාර එල්ල විය.සරත් ගුවන් විදුලි සංඥා යන්ත්‍රය මගින් නිතර නිතර සුමිත් පිළිබඳව සොයා බලයි.සරත් මවට මෙන්ම තමන්ගේ සිත ගෙන සිටි යෞවනියටද ලියුමක් ලියන්නට අමතක කලේ නැත. සමහර ලිපියක් ලැබෙන විට ඊලග නිවාඩුවද ලංවී තිබුණි. සුමිත් මුහමාලේ ඉදිරි ආරක්‍ෂක වලල්ලේ රාජකාරී කල පාබල ඒකකයකට අනුයුක්තව සිටි අතර නිතර නිතර මෙහි යුධ ගැටුම් ඇවිලි යයි. සුමිත් තම ඒකකයේ තමන් අයත් කණ්ඩායමේ හොඳ හිත දිනාගෙන සිටි සෙබලෙකු විය. සතුරු බළප්‍රදේශයට හොර රහසේ ඇතුල්වී ප්‍රහාර එල්ල කරන කුඩා කණ්ඩායම් සමගින් ගොස් සතුරාට දැවැන්ත ප්‍රහාර එල්ල කිරීමට සුමිත් වඩාත් දක්‍ෂයෙකු විය. සරත්ට මෙන් මේ වන විට සුමිත් හට පෙම්වතියක් නොවූ අතර තම සොයුරා ඇතිකරගෙන තිබුණු පෙම් පලහිලව්ව සුමිත් දැන සිටි අතර '' අම්මේ අයියට මොකුත් කියන්න එපා. සමදරා වුනත් හොඳ කෙල්ල ඔය විදියට ටික කාලයක් ගියදෙන් හෙට අනිද්දට බඳිනවා නෙමෙයිනේ'' යැයි ඔහු ප්‍රකාශ කර තිබුණේද ඒ පිළිබඳව ඔහුද හොඳ දැක්මකින් සිටි නිසාවෙනි.

සරත් සහ සුමිත්ගේ ගම් පලාතට මේ දිනවල නිතර නිතර යුද්ධයේදී මියගිය විරුවන්ගේ දේහයන් රැගෙන එමින් තිබුණි. මේ විස්තර නිතර නිතර කන වැකීම නිසා ඔවුන්ගේ මවටද රෑ දාවල හිතට සහනයක් නොවිය. හිටි හැටියේම රෑ මැද්දේ අවදිවන ඇය කල්පනා කරමින් හිදි වර්පිතව සිටින්නීය. දිනක් හදිසියේම ඔවුන්ගේ නිවස වෙත පැමිණි පොලිස් නිලධාරීන් දෙදෙනෙකු මියගිය හමුදා සෙබලෙකුගේ නිවසට යන පාර අසා සිටි මොහොතේ තමන්ගේ අතපය වාරු නැති වූ ඇය පාර කියාගන්න නොහැකිව ක්ලාන්ත වී කිරි ඉද්ද වැටට වාරු විය. පසුව අසල නිවසට කථා කල ඔවුන් මව ඔවුන් වෙත බාරදී ඔවුන්ගේ රාජකාරිය සඳහා පිටත්ව යන ලදි.

දිනක් සවස පහන් පැලේ පහන දල්වා නිවසට පැමිණි සරත් හා සුමිත්ගේ මවට කවදාකවත් නොවූ සිදුවීමක් නිසා හිත ගැස්සී ගියේය. එනම් සුලඟක්ද නොවූ ඒ මොහොතේ කවදාවත් නොනිමෙන පහන නිවී ගියේය. ඇගේ සිත මොහොතකට දෙගිඩියාවෙන් පිරුණු බවක් ඇයට දැනුණු අතර නැවත පහන් පැල වෙත ගිය ඇය නැවතත් පහන දල්වා නිවස තුලට වී දරුවන් දෙදෙනා පිළිබඳව කල්පනා කරන්නට විය. එදා රැය පුරා ඇයට නරක හීන පෙනෙන්නට විය. පසුදින ඇය මේ පුවත පිළිබඳව ඇගේ සොයුරියටද දන්වා සිටි අතර ඇය විසින් ඇගේ සිත අස්වසාලන

ලදි. ගුවන් විදුලියට කන් දුන් ඇයට මුහමාලේ දරුණු සටන් මගින් සොල්දාදුවන් රාශියක් මියගොස් තවත් පිරිසක් අතුරුදහන් වී ඇති බවද දැනගන්නට ලැබීමෙන් දැඩි බියක් සිතට දැනුනි. නිවසේ ඉදිරියට වී ඇය කල්පනා කරමින් දවස ගෙවන්නට විය. එදින එකවර සතුරන් විසින් යාපනය ඉදිරි ආරක්ෂක වලලු කිහිපයකට දැඩි ප්‍රහාර එල්ල කර තිබූ අතර එකවර ප්‍රහාර එල්ල කරමින් මුහමාලේ ඉදිරි ආරක්ෂක වලල්ලෙන් ඔබ්බට යුධ හමුදාව සතුව තිබූ ප්‍රදේශය අල්ලා ගැනීමේ තැතක් තිබුණු බව පසුව සතුරන්ගේ ගුවන් විදුලි සංඥා පණිවිඩවලට ඇහුම්කන්දීමෙන් තහවුරු කරගන්නා ලදි. නාගර්කෝවිල් මුහුදු ආරක්ෂක සීමාවටද මුහුදු කොටි මගින් ප්‍රහාර එල්ල වූ අතර එය සාර්ථකව මැඩ පවත්වා තිබුණි. සරත් තම සොයුරාගේ ඒකකය ගුවන් විදුලි සංඥා මගින් සම්බන්ධ කරගැනීමට කීපවරක් උත්සහ කලද එය ව්‍යර්ථ වී ගියේය.

තම සොයුරා පිළිබඳව තොරතුරු සොයාබැලීමට නොහැකි වී සිත් කනස්සල්ලෙන් සිටි සරත් වෙත ඔහුගේ මූලස්ථානය වෙත කඩිනමින් පැමිණෙන ලෙස පණිවිඩයක් ලැබුණේ මේ අතරවාරයේදිය. එසේ හදිසි කැඳවීම කුමක් සඳහාද යන්න සඳහන් කලේ නැත. එහෙත් සරත්ට වෙනදා තමන්ට නොදැනුණු හිතේ මහ බරක් තිබෙන බව දැනුනමුත් ඒ කුමක්ද යන්න ගැටලුවක් විය. සරත් මූලස්ථානය වෙත පැමිණි විගස අණදෙන නිලධාරී වෙත ඉදිරිපත් කල අතර හදිසි නිවාඩුවක් ලබා නිවසට යාමට සූදානම් වන ලෙස දැනුම් දෙන ලදි. සරත් හට එය මහත් ගැටලුවක් විය. පසුව සරත් වෙත පැමිණි ඔහුගේ අණදෙන නිලධාරීවරයා සරත්ගේ එකම සොයුරා සුමිත් හට කරදරයක් සිදුවී තිබෙන බව දැනුම්දී කලබල නොවන ලෙස දැනුම් දෙන ලදි. එහෙත් තමන් විර සොල්දාවෙකු වුවද තම සහෝදර සෙනෙහස ඒ අබ්බවා නැගෙන බව ඔහුගේ නෙත් සාක්ෂි දැරිය. සොල්දාදුවෙකු වූ ඔහු සිත් විර්යයෙන් නැගී සිටිය යුතු මොහොතක් බව ඔහුගේ අණදෙන නිලධාරී විසින් පහදා දුන් අතර ඒ වන විටත් තමන්ගේ එකම සොයුරා ඊයේ සවස පැවැති දැඩි සටන් තත්වයෙන් මේ වන විටත් සියල්ල අතහැර සමුගෙන තිබෙන බව සරත් දැන ගන්නා ලදි. ඔහුගේ හදවත නැවතුන බවක් ඔහුට දැනුනි. එදා සිට තමන්ට එකම සොයුරා හිතවතාද මිතුරාද වූ ඔහු මියගිය බව ඔහුට සිහිනයක් බඳු විය. සටන් පුහුණුවේදී එකට පුහුණු වූ අන්දමත් බාලේ සිට එක බත්පත දෙකට බෙදා කෑ අන්දමත් චිත්‍රපටයක දසුන් සේ එකිනෙකින් ඔහුගේ මනසේ දිග හැරුනි.

අවසානයේදී මේ ජිවිතයේ සැබෑ ඉරනම යැයි හිත හදාගත්තද තම සොයුරා මියගිය බව තම මවට කියන්නේ කොලෙසින්ද යන ප්‍රශ්ණයට සරත් තුළ පිළිතුරු නොවිය. පලාලි කඳවුරින් තම මාමා වෙත ගමේ තැපැල් කන්තෝරුව මගින් දිය යුතු පණිවිඩය සරත් විසින් ලබාදෙන ලදි. ඒ වනවිටත් ලඟම පොලිස් ස්ථානය වෙතින් තම නිවසට පණිවිඩය ලබාදෙන්නට ඇති බව සරත් දනී. තම මව මේ දුක ඉවසා දරාගන්නට සමත්වීම පිළිබඳව සරත් හට සිතාගන්නට වත් බැරි විය. පලාලි යුධ හමුදා රෝහල වෙත පැමිණි සරත් හට තම සොයුරාගේ නිසල දේහය දැක ගන්නට හැකි විය. වසා තිබූ සුදු රෙදිකඩ මෑත්කල විට එදා වගේම සොයුරු බැදීමෙන් සිනාසෙන දෑස් පියවී තිබුණි. හදවතට හා හිසට කිදා බැස තිබූ වෙඩි උණ්ඩ නිසා සුමිත් මියගොස් තිබුණද අවටින් හැමූ ලේ සුවඳ පරයමින් සරත්ට තම සොයුරාගේ ජිවන සුවඳ දැනෙන්නට විය. සුමිත්ගේ දේහය කොනක ඔහුගේ සෙබල අංකය ඒකකය සමගින් සුමිත් බංඩාර යන නම දුටු විට “ අනේ අද මේ නම වෙනුවට මගේ නම මෙතැන තිබුණා නම් මීට වඩා හොදයි නේද” යැයි සරත්ට සිතුනි. මීට වසර 03 කට පෙර පමණ පෙර මලහිරු බැස යන සැන්දෑවක තමාත් තම සොයුරාත් එකම ගුවන් යානයෙන් රත්මලාන සිට පලාලි දක්වා එකට ගමන් ගත් ගුවන් ගමන් වාරය සරත්ට මතක් විය. දෛවයේ සරදමක මහත අද පලාලි සිට තම සොයුරාගේ නිසල දේහය සමගින් ගුවන් මගින් රත්මලාන දක්වා යෑමට සිදුව ඇත. එහෙත් අද තම සොයුරා කිසිදා යලිත් හඬ අවදි නොකරන්නටම නිහඬ වී ඇති අතර අද මේ ගෙවන මළහිරු බැස යන සැදෑව මහ මුසල බවක් දනවන බව සරත්ට සිතුණි.

සුමිත්ගේ නිසල දේහය සමගින් නිවාඩු ලබා නිවෙස් වෙත යන විශාල සෙබලුන් රැසක් හා තවත් නිසල සෙබල දේහයන් කිහිපයක්ද එම ගුවන් යානයේ විය. සුපුරුදු කාර්ය බහුල පලාලි ගුවන් තොටින් එම ගුවන් යානය උඩු ගුවනට නංවා මුහුදු සීමාව තෙක් උතුරු දෙසට හැරී නොපෙනී ගියේය. බටහිර අහසේ ක්ෂිතිජ රේඛාවේ ගැවී ගෑවී තිබුණු ඉර ද ක්ෂණයකින් මහ සයුරේ ගිලී යනු තල් ගස් අතරින් පෙනුණි.

දකුණේ ගම් දනවි පුරා කඩපිල්වල ගුවන් විදුලි යන්ත්‍ර සහ රූපවාහිනී යන්ත්‍ර වට කරගෙන උතුරේ යුද පුවත් අසන පිරිස් දිස් වෙයි. ඊයේ සවස පලාලි ගුවන් තොටින් මියගිය සොල්දාදුවන් තුවාලකරුවන් හා සොල්දාදුවන් රැගෙන පැමිණෙමින් තිබූ ශ්‍රී ලංකා ගුවන් හමුදාවට අයත් ගුවන් යානයක් අතුරුදහන්වී ඇති බවත් ඒ පිළිබඳව මේ වන විටත් කිසිදු තොරතුරක් නොමැති බවත් එය එල්ටීටීඊ මිසයිල ප්‍රහාරයකට ගොදුරු වන්නට ඇති බවට සැකකරන බවත් හදිසි ප්‍රවෘත්ති විකාශනයෙන් ප්‍රකාශ විය. එම අතුරුදහන් වූ ගුවන් යානයේ සුමිත්ගේ දේහය සමගින් පැමිණි සරත් ද සිටින ලද අතර එම පුවත සැනෙකින් සරත් හා සුමිත්ගේ නිවස වෙත ලබාදී තිබුණි. සුමිත්ගේ අභාවය පිළිබඳව අසා තිබුණු මවට ඇයගේ සොයුරා මේ හදිසි පුවත ලබා නුදුන්නද වටින් කොටින් ඇය අනෙක් හදිසි සිදුවීමද දැනගත් අතර ඈ විටින් විට සිහි මුර්ජා වූ අතර සිහිය ලැබුවද ඒ මොහොතෙහිම තම පුතුන්ගේ නම් කියමින් යලිත් ඇද වැටෙයි.

තම පුතුන් තම මව්බිමේ ඒකියභාවය සුරකින්නට ගොස් මිය ගියද ඉන් තැවෙන්නට තරම් මේ බිමේ මවුවරුන් ආත්මාර්ථකාමී වී නැත. සිය දහසක් තම පුතුන් මේ බිමේම නිදහස වෙනුවෙන් පූජාකලේ මේ බිමේම අපේ අම්මාවරුන් මිස වෙන කවුරුන්ද. තම ලේ කිරිකර පොවා ඇතිදැඩි කල පුතුන් මව්බිමේ නාමයෙන් ලේ හෙලා තම සුසුම් වාතලයට එක්කරන විට දුක දැනෙන්නේද එම මවුවරුන්ටය. තම මව්බිම වෙනුවෙන් මැරී මැරුණු සුමිත් ලා වැනි තව සියදහසක් විරුවන් නිසා අද මව්බිමට සාමයේ අරුණළු වැටී ඇත. එදා තම දිවි මව්බිමට පුජාකල තම පුතුන් වෙනුවෙන් පිදෙන උත්තමාචාරය පිළිගැනීමට සරත් හා සුමිත්ගේ මවට සෙංකඩගල පුරවරයේ පැවැති රණවිරු අනුස්මරණ උත්සවයට ආරාධනා ලැබුණි.තම බාල පුත් සුමිත්ගේ නම කියවෙන විට දෙපයින් නැගී සිටි මවට වැඩි දුරක් යෑමට නොහැකි විය. දෑත් එක්කර තම පුතුගේ ඡායාරූපයට වදින්නට හදනවාත් සමගම ක්ලාන්ත වූ ඇය කාන්තා සෙබලියන් දෙදෙනෙකු විසින් වත්තම් කරගෙන ගොස් අසල අසුනක හිදුවන ලදි. “ පුතේ මගේ පුතාලට වැන්දට මට පව් නෑ. මගේ පුතාලගේ මලකදවත් මට දකින්න නැතිවුන එකයි මට හිතට දුක” යැයි සිහිය ලැබූ විගසම ඇය කෙපලිය. සියලු විරුවන් වෙනුවෙන් වැයෙන නලා හඬ එම ශාලාව පුරා දෝංකාර දෙන විට එම මවගේ දෑසින් කඩා වැටුණු කඳුළු බිඳුවක් විදුලි බුබු එළියෙන් ඒකාලෝක වී මොහොතක් රැඳී තිබී ක්ෂණයකින් පොලවට වැටුණි. මැරී මැරුණු එවන් සිය දහසක් විරුවන් ඔවුන්ගේ දවස් අපගේ හෙට දිනය වෙනුවෙන් කැප කල

නිමි

මේජර් ඊඩී ගුණරත්න ආර්එස්පී

## අන්තර් ඒකක

# මලල ක්‍රීඩා තරගාවලිය 2015



ශ්‍රී ලංකා පාබල හමුදා අන්තර් ඒකක මලල ක්‍රීඩා තරගාවලිය ඉතා උත්කර්ෂවත් අයුරින් 2015 ජුලි මස 29,30 යන දෙදින තුළදී දියගම මහින්ද රාජපක්ෂ ක්‍රීඩාංගනයේදී පැවැත් විය. ශ්‍රීලපාහ රෙජිමේන්තුවේ නිත්‍ය ඒකක 15, ස්වේච්ඡා ඒකක 8 ක් ද, රෙජිමේන්තු මූලස්ථානය බළඇණිය සමගින් බළඇණි 24ක ක්‍රීඩකයින් රැසකගේ දක්ෂතා පිළිබිඹු කිරීමට මෙහිදි අවස්ථාව උදා විය. 2015 ජුලි මස 29 දින ක්‍රීඩා උත්සවය ආරම්භ කිරීම කොතලාවල ආරක්ෂ විශ්ව විද්‍යාලයේ නියෝජ්‍ය උපකුලපති මේජර් ජෙනරාල් ජේආර් කුලතුංග ආර්ඩබ්ලිව්ස්පී එන්ඩීයු පීඑස්සී විසින් සිදුකරන ලදි.

අවසන් දින ප්‍රධාන ආරාධිත අමුත්තා වශයෙන් ශ්‍රීලපාහ රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් කේවීඩීවී කරුණාසේකර ආර්ඩබ්ලිව්ස්පී වීඑස්වී යුඑස්පී එන්ඩීයු පීඑස්සී සහභාගි විය. එම අවස්ථාවට රෙජිමේන්තු මධ්‍යස්ථාන සේනාවිධායක බ්‍රිගේඩියර් එම්එම් කිත්සිරි ආර්ඩබ්ලිව්ස්පී, පාබල හමුදා ක්‍රීඩා මණ්ඩලයේ සභාපති බ්‍රිගේඩියර් එම්පී ගුණසිංහ ආර්ඩබ්ලිව්ස්පී, ඇතුළු ශ්‍රීලපාහ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් හා විශ්‍රාමික නිලධාරීන් ද සෙසුනිලයන් විශාල පිරිසක් සහභාගි විය.

දක්ෂතා දැක්වූවන් හට ත්‍යාග ප්‍රධානය රෙජිමේන්තු අධිපති තුමාගේ ප්‍රධානත්වයෙන් සිදු කළ අතර, තරගාවලියේ ශූරතාවය 4 ශ්‍රීලපාහ, අනුශූරතාවය රෙජිමුඛ ශ්‍රීලපාහ දිනාගන්නා ලදි. මෙහිදි තරගාවලියේ දක්ෂතම ක්‍රීඩකයා හා දුරපැනීමේ දක්ෂතම ක්‍රීඩකයා වශයෙන් සෙ/100821 සාසෙ ප්‍රනාන්දු එච්ඒටී, මීටර් 400 කඩුළු පැනීමේ තරගයේ දක්ෂම ක්‍රීඩකයා සෙ/894454 සාසෙ දිසානායක ආර්එම්එස් මෙහිදි ත්‍යාග ලබාගන්නා ලදි.



තරඟාවලියේ ශූරතාවය 4 වන ශ්‍රීලංකා පාබල හමුදාව



තරඟාවලියේ අනුශූරතාවය රෙජිමුඛ ශ්‍රීලපාහ





# ශ්‍රී ලංකා පාබල හමුදා සංගමය
# 2015 වසර නිලධාරි මණ්ඩලය





ශ්‍රී ලංකා පාබල හමුදා විශ්‍රාමික සංගමයේ මහා සභා රැස්වීම 2015 මාර්තු මස 29 දින ශ්‍රීලපාහ රෙජිමේන්තු මධ්‍යස්ථානයේදී පැවැත්වීය. එදින නවතමයෙන් තේරී පත්වූ නව නිලධාරි මඩුල්ල පහත පරිදි වේ.

## ජ්‍යෂ්ඨ ප්‍රධාන අනුශාසක

මේජර් ජෙනරාල් සීඒඑම්එන් සිල්වා වීඑස්වී යූඑස්ඒඩබ්සී

## ජ්‍යෂ්ඨ උප අනුශාසකවරුන්

මේජර් ජෙනරාල් එන් මල්ලවආරච්චි ආර්ඩබ්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී
දේශමාන්‍ය මේජර් ජෙනරාල් ඒකේ ජයවර්ධන ආර්ඩබ්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී ආර්සීඩීඑස් පීඑස්සී
මේජර් ජෙනරාල් සීජේ රණවීර ආර්ඩබ්පී ආර්එස්පී යූඑස්පී

## ගරු භාරකාර මණ්ඩලය

රෙජිමේන්තු අධිපති නිල බලයෙන්
මේජර් ජෙනරාල් යූඒ කරුණාරත්න පීඑස්සී
ලුතිතන් කර්නල් ඩබ්ආර්බී රත්නායක
කපිතාන් ජේඑල්සී ප්‍රනාන්දු
ධර්මදාස මොහොට්ටි මහතා

## කළමණාකරන මණ්ඩලය

රෙජිමේන්තු අධිපති තුමා හෝ නියෝජිත මහතෙකු
ගරු සභාපති  මේජර් ජෙනරාල් ටීටීආර් ද සිල්වා ආර්ඩබ්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී පීඑස්සී
ගරු උපසභාපති  බ්‍රිගේඩියර් ඒපීඩී එදිරිසූරිය කේඑස්වී
ගරු ලේකම්  කපිතාන් ඩබ්ජේ සිරිවර්ධන යූඑස්පී
ගරු උපලේකම්  කපිතාන් ඩබ්එම් විමලචන්ද්‍ර යූඑස්පී
ගරු භාණ්ඩාගාරික  මේජර් එච්ඩී දයානන්ද රංසි යූඑස්පී
ගරු උපභාණ්ඩාගාරික  බනි II ප්‍රේමතිලක ගම්ලත්
බ්‍රිගේඩියර් එස්පීඑම්බී ඇහැලමල්පේ ආර්එස්පී
මේජර් එච්පී වීරක්කොඩි ආර්එස්පී
මේජර් කේඒඑස්එච් කරුණාතිලක ආර්එස්පී
මේජර් එච්ඩීජීපී රණසිංහ ආර්එස්පී
මේජර් බීඑස් ද සිල්වා
කපිතාන් ඒ ප්‍රේමචන්ද්‍ර
කපිතාන් ජේඑස් බණ්ඩාර
බීපී කුලරත්න මහතා
එම්ඩී සිල්වා මහතා
එම් අමරදාස මහතා දේශාභිමානී
යූඩී අල්විස් මහතා
කේඒ බුද්ධදාස මහතා
අතිරේක  ටීඩීඑන් ඥාණසිරි මහතා

## සේවාමුක්ත භට සංගමයේ යෝජිත නියෝජිතයින්

මේජර් එච්කේ ජයරත්න
මේජර් කේඑම් ගුණරත්න බණ්ඩා
කපිතාන් මහින්ද ගුණවර්ධන
ලුතිතන් ඩබ්එම් ගුණතිලක
පීඑල් රත්නවීර මහතා
පීනදාස ගමගේ මහතා
ඩබ්පී සිල්වා මහතා

## සේවාමුක්ත භට සංගමයේ මාසික රැස්වීම සඳහා නියෝජිතයින්

ලුත්තන් කර්නල් ඊඑම්යූ ඒකනායක ආර්එස්පී යූඑස්පී
කපිතාන් ඩබ්ජේ සිරිවර්ධන යූඑස්පී
බීපී කුලරත්න මහතා

## ගිණුම් පරීක්ෂණ මණ්ඩලය (අභ්‍යන්තර)

ලුතිතන් කර්නල් ඊඑම්යූ ඒකනායක ආර්එස්පී යූඑස්පී
මේජර් බීඑස් ද සිල්වා
එම්ඩබ් සුගතදාන මහතා(සා.වි)

## ගිණුම් පරීක්ෂණ මණ්ඩලය (භාහිර)

හර්ෂිත බණ්ඩාර සහ සමාගම



සැකසුම:
**කපිතාන් ඩබ්ජේ සිරිවර්ධන යූඑස්පී**

## (සෙව්) ශ්‍රීලපාහ 9 පුවත්

# අසරණ රෝගීන්ගේ කුසගිනි නිවූ 9 ශ්‍රීලපාහ



වැලිඔය ප්‍රදේශයට ආසන්න ගමක් වන වහල්කඩ ග්‍රාමයේ පිරිත් පැන් සහ ස්වභාවික ඖෂධ වර්ග භාවිතයෙන් රෝග සුවකරන ස්වාමීන් වහන්සේ නමක් වාසය කරයි. මේ පිළිබඳව සොයා බැලූ අණදෙන නිලධාරි ලුතිතන් කර්නල් පීඩීඑම්පී විජේගුණවර්ධන ආර්එස්පී ශ්‍රීලපාහ වහල්කඩ ඩී 1 ප්‍රදේශයේ විහාරස්ථානයේ වැඩ වසන එම ස්වාමීන් වහන්සේ මුනගැසීම සඳහා එම විහාරස්ථානයට යන ලදී. නිර්මාංශ දානය ලබා ගන්නා භික්ෂුවක් හා ඉංග්‍රීසි වෛද්‍ය ප්‍රතිකාර ප්‍රතික්ෂේප කරමින් සුව කළ නොහැකි රෝගීන් කිසිදු අය කිරීමක් නොමැතිව සුව කරන මෙම බෞද්ධ භික්ෂූන් වහන්සේ මුණගැසී උන්වහන්සේගේ අවසරය ලබාගෙන් ප්‍රතිකාර අවැසිව පැමිණෙන රෝගීන් 120 ක් සඳහා ප්‍රණීත ආහාර වේලක් ලබාදීම 2015.08.15 දින අණදෙන නිලධාරී අතින් සිදු කෙරිණ.

# මිහින්තලාවයි දහම් අමාවයි





මිහිඳු මා රහතන් වහන්සේ ලක් දෙරණ තුලට වැඩම කොට ලංකාව තුල බුදු දහාම ප්‍රචලිත කරනු ලැබූ පොසොන් පොහෝ දිනය පෙර මෙන්ම මෙවරද අණදෙන නිලධාරීතුමන් සමඟින් ඒකකයේ අනෙකුත් නිලධාරි/සෙසුනිලයින් බැති සිතින් යුතුව සැමරී ය. ඒ අනුව කදවුර භූමිය ඉදිරිපස මිස්සක පව්වෙහි අනුරුවක් ඉදිකොට එය සිවිල් ජනතාවට දැක බලා ගැනීමට ඉඩ සලස්වන ලදි.

අද සාමාජය තුල ජිවත් වන බොහෝ පිරිස් බුදු දහාමෙන් ඈත්ව වෛරය, ඊර්ෂ්‍යාව, සැකය හදවත් තුල උපදවාගෙන අකාලේ තම ජිවිත පරිහානියට පත්කර ගන්නා මෙවන් කාල වකවානුවක වෙහෙර විහාරස්ථාන ඉදිකරමින් අන් අයගේ සුභ සාධනය සහ සැපත වෙනුවෙන් බොහෝ ආගමික වැඩ කටයුතු සිදු කරමින් බෞද්ධ ආකල්පයන්ට අනුව අප සැමගේ සිත් බෞද්ධ සිතුවිලි තුලින් පෝෂණය කරන්නට විශාල මෙහෙවරක නිරතව සිටින අණදෙන නිලධාරී තුමන් හට ඒකකයේ නිළධාරි/සෙසුනිළයින්ගේ නොමද ගෞරවය පිරිණමමි.

# පූජනීය ස්ථාන සංවර්ධනයට අතහිත

පෙර සිටි බෞද්ධ රජ දරුවන් එකල වෙහෙර විහාර ප්‍රතිසංස්කරණය කිරීමට උර දී කටයුතු කළා සේ එවන් වූ ආදර්ශයක් ලබා දෙමින් අණදෙන නිලධාරි ලුතිතන් කර්නල් පීඩීඑම්පී විජේගුණවර්ධන ආර්එස්පී ශ්‍රීලපාහ තම පෞද්ගලික ධන පරිත්‍යාගයෙන් ඇහැටුගස්වැව ශ්‍රී සංබෝධි විහාරස්ථානයේ ධාතු මන්දිරයේ ඉදිකිරීම් කටයුතු සදහා සිමෙන්ති ගඩොල් කැට 150ක් 2015.08.15 දින විහාරාධිකාරී වෑගොව්වේ විමල බුද්ධි හිමියන් වෙත පරිත්‍යාග කරන ලදී. මෙම පරිත්‍යාගය එදින කපිතාන් ඩීඑම් විජේරත්න ශ්‍රීලපාහ විසින් සිදු කෙරිණ.



8 ශ්‍රීලපාහ පුවත්

# බලඇණි පුහුණුවීම්

## "සෙබළුනට ලබාදිය හැකි උතුම්ම දායාදය යුද පුහුණුවයි"





ඒකක අණදෙන නිළධාරි ලුතිතන් කර්නල් එල්එච්සිආර් සිරිවර්ධන ආර්එස්පි ශ්‍රීලපාහ යන ජ්‍යෙෂ්ඨ නිළධාරීගේ පූර්ණ අධීක්‍ෂණය යටතේ හා පුහුණු පාසලේ ප්‍රධාන උපදේශක ඇතුලු උපදේශක මඩුල්ලෙන්ද යටතේ 2015.04.27 දින ආරම්භ වූ අතර, පාඨමාලා කාලය තුල එම ප්‍රදේශයේ පැවති අධික වියලි කාලගුණික තත්වයන් මධ්‍යයේ සියලු අභියෝගයන් ජයගනිමින් පුහුණුවීම් වල නිරතවීමට බළඇණි සෙබලුන් එකමුතුව හා ධෛර්යයෙන් ක්‍රියාකලහ. ක්‍රමවත් පුහුණු කාලසටහනක් යටතේ ශාරීරික යෝග්‍යතා පරීක්‍ෂණ, සිතියම් කියවීම, කොම්පාසු සංචාරය, ජීව වෙඩි තැබීම් (දිවා/රාත්‍රී), යුධ උපක්‍රම, නගරබද සටන්, අභ්‍යන්තර ආරක්‍ෂක රාජකාරි, ප්‍රතිවිප්ලවකාරි සටන, මාර්ග බාධක හා වන අභ්‍යාසය ප්‍රායෝගික පුහුණුවීම් තුලින් කණිෂ්ඨ නායකයින්ගේ නායකත්ව ගුණාංග වර්ධනය කර ගැනීමට හා සෙබලුන්ගේ දැනුම වර්ධනය කර ගැනීමට ද හැකි විය. පුහුණුවීම් අතරතුරදී අධ්‍යක්‍ෂ පාබලඅම පුහුණු බ්‍රිගේඩියර් ඩීසී කැප්පෙට්වලාන ආර්එස්පී පිඑස්සී යන ජ්‍යෙෂ්ඨ නිළධාරිගේ නිරීක්‍ෂණ චාරිකාවක්ද සිදුකරන ලදි.

අණදෙන නිළධාරිතුමාගේ සංකල්පයක් මත පුහුණු කාල සීමාව තුලදී මානසික ඒකාග්‍රතාවය පවත්වාගෙන යාම සඳහා සෙබලුන් හට එල්ලේ, ක්‍රිකට්, පාපන්දු හා අත්පන්දු තරග පවත්වමින් අධ්‍යාපනික මෙන්ම විනෝද චාරිකාවන් යාම සඳහා ද අවස්ථාව ලබාදෙන ලදී. මෙම පුහුණුවීම් 2015.04.27 වන දින සිට 2015.06.05 වන දින දක්වා දින 40 ක් නිළධාරීන් 13 දෙනෙකු හා සෙසුනිළයින් 326 දෙනෙකුගේ සහභාගිත්වයෙන් ඉතා සාර්ථකව සිදුකරනු ලැබීය. පුරා මාස එකාහමාරකට ආසන්න කාලයක් සිදුකරන ලද මෙම සාමුහික පුහුණුවීම් තුලින් දී සෙබළාට ලබාදිය හැකි උතුම්ම දායාදය යුද පුහුණුවයි යන තේමා පාඨයට අරුතක් ලබාදෙමින් 2015.06.05 වන දින පුහුණුවීම් අවසන් විය. පාඨමාල ඇගයීම් පරීක්‍ෂණයන්ට අනුව හොදම කණ්ඩායම "බී" කණ්ඩායම ලෙසද, දක්‍ෂතම කණ්ඩය "සී" කණ්ඩායමේ පලවන කණ්ඩය ලෙසද, දක්‍ෂතම පෙළ "බී" කණ්ඩායමේ පලවන කණ්ඩයේ තුන්වන පෙළ ලෙසද දක්‍ෂතම වෙඩික්කරු ලෙස "සී" කණ්ඩායමේ නිළධාරි අණදෙන නි/66630 කපිතාන් ඩබ්ලිව්වල් ප්‍රසන්න ආර්එස්පි ශ්‍රීලපාහ ලෙසද, දක්‍ෂතම ශාරීරික යෝග්‍යතාවය හෙබි සෙබලා ලෙස "ඩී" කණ්ඩායමේ සෙ/556461 සාසෙ රණතුංග ආර්ඒඅයි වීසින්ද පාඨමාලාවේ දක්‍ෂතම ශිෂ්‍යයා ලෙස "සී" කණ්ඩායමේ නිළධාරි අණදෙන නි/68885 ලුතිතන් එස්සි ත්‍රිමාවිතාන ශ්‍රීලපාහ විසින් ද, 141 බළසේනා මුලස්ථානයේ බළසේනාධිපති කර්නල් කේආර්ක්කෙරී බංඩාර ආර්එස්පි යුඑස්පි ගේ සුරතින් කුසලාන හිමිකර ගන්නා ලදී. පුහුණු පාසල වෙත පැමිණෙන අමුත්තන් සඳහා ගොඩනැගිල්ලක් ඉදිකරදීම හා සෙසු නිලයින්ගේ ප්‍රයෝජනය සඳහා කැරම් බෝඩ් දෙකක් අණදෙන නිළධාරී අතින් ලබාදීමද මෙහිදී සිදුවිය.

## මිනිසාගේ පරම යුතුකම මිනිසාට සේවය කිරීමයි

මෙම ඒකකයට අයත් සෙ/310190 ලාකෝ දඹගල්ල ඩීපී යන කොනොනිගේ අවුරුදු 16ක් වයසැති පුතණුවන් උපතින්ම ආබාධිත තත්වයට පත්වී නිවසේ කාලය ගත කරයි. එම පුතණුවන්ගේ දෛනික අවශ්‍යතාවයන් තනිව සිදුකර ගැනීමට නොහැකිවීමෙන් ඒ වෙනුවෙන් වෙනත් අයෙකු යෙදවීමට සිදුවී ඇත.

මෙම අසරණතාවය පිළිබඳ කරුණු වටහාගත් ඒකකයේ රාජකාරි කරනු ලබන සෙ/322087 සාසෙ සමන් කුමාර එම්පීජී යන සෙබලා තම පුද්ගලික ධන පරිත්‍යාගයෙන් රු:10000.00ක් වටිනා රෝද පුටුවක් පරිත්‍යාග කළ අතර, තවද ඒකක දෙවන අණදෙණ නිළධාරි මේජර් අයිකේඒසි කුමාර ආර්එස්පි ශ්‍රීලපාහ විසින් රු:10000.00ක් වටිනා වැසිකිලි උපකරණ කට්ටලයක් ලබාදෙන ලදී මෙම පරිත්‍යාගයන් අණදෙන නිළධාරි ලුතිතන් කර්නල් එල්එච්සිආර් සිරිවර්ධන ආර්එස්පි ශ්‍රීලපාහ සහභාගීත්වයෙන් 2015.07.13 වන දින සිදු කෙරිණ. මෙම උතුම් ආදර්ශමත් ක්‍රියාවට දායක වූ රණවිරුවන්ට සමස්ථ යුද හමුදාවේ කෘතවේදීත්වය පිරිනැමිය යුතුය.







Inter Regiment
**DRILL COMPETITION – 2015**
# 4TH PLACE
Sri Lanka Light Infantry Regiment

# අන්තර් රෙජිමේන්තු සරඹ තරඟාවලියේ 4 වන ස්ථානය රෙම ශ්‍රීලපාහ

යුද හමුදා සියලු රෙජිමේන්තු සරඹ කණ්ඩයන් නියෝජනය කරමින් වාර්ෂිකව පවත්වනු ලබන අන්තර් රෙජිමේන්තු සරඹ ශූරතා තරඟාවලිය 2015.08.11සිට 13 දින දක්වා 6 වන ශ්‍රීලංකා කාලතුවක්කු හමුදා සරඹ පිටියේදී උත්සවශ්‍රීයෙන් පවත්වන ලදී. මෙම තරඟාවලිය සඳහා රෙජිමේන්තු නියෝජනය කරමින් සරඹ කණ්ඩායම් 23 ක් තරඟය සඳහා සහාගී වූ අතර, එහිදී තරඟාවලියේ 4 වන ස්ථානය හිමි කරගැනීමට පාබල හමුදා රෙජිමේන්තු සරඹ කණ්ඩායමට හැකිවිය. පසුගිය වසරේ මෙන් නොව සරඹ පිටියේ අණදෙන නිලධාරිගේ මනා හැසිරවීමත්, සරඹ උපදේශක තුමන්ගේ මනා මගපෙන්වීමත් සහ නිවැරදිව පෙර පුහුණුවීම් සිදු කිරීමත් නිසා මෙවර රෙම ශ්‍රීලපාහ සරඹ කණ්ඩයට දක්‍ෂතා මතින් ඉහළ තලයකට ඒමට හැකිවිය.

තරඟවලියේ පිරිපුන් දක්‍ෂතා දක්වමින් 4 වන ස්ථානයට පැමිණි රෙම ශ්‍රීලපාහ සරඹ කණ්ඩායමේ සරඹ පිටියේ අණදුන් නි/66889 කපිතාන් ජේයූඩීඉ විතාන ආර්ඩබ්ලිව්පී ආර්වීඑස්පී ශ්‍රීලපාහ සරඹ උපදේශක. සෙ/306910 බනි 1 පීජීසීපීකේ ජයරත්න හා තියුණු තරඟයක් ලබාදුන් රෙම ශ්‍රීලපාහ සරඹ කණ්ඩායමේ සියලුම සාමාජිකයින්ටත් පාලබ හමුදා රෙජිමේන්තු අධිපති තුමන් ඇතුලු සියලුම නිලයින්ගේ සුභ පැතුම් මෙසේ එක්කරමු.

## අන්තර් රෙජිමේන්තු සරඹ උපදේශක තරඟාවලිය 4 වන ස්ථානය රෙම ශ්‍රීලපාහ








අන්තර් රෙජිමේන්තු සරඹ තරඟාවලියට සමගාමීව රෙම ශ්‍රීලකාහ සරඹ පිටියේ දී සරඹ උපදේශක සරඹ (පියවර කෝදු) සරඹ තරඟාවලියක් 2015.08.15 දින පවත්වන ලදී. ප්‍රථම වතාවට පැවති මෙම තරඟාවලිය සඳහා රෙජිමේන්තු 20ක සරඹ උපදේශක කණ්ඩායම් තරඟය සඳහා පැමිණි අතර, එහිදී එම තරඟාවලියේ 4 වන ස්ථානය දිනාගැනීමට රෙම ශ්‍රීලපාහ සරඹ උපදේශක කණ්ඩායමට හැකිවිය.

### රෙම ශ්‍රීලපාහ සරඹ උපදේශක කණ්ඩායම

- සෙ/9ඩී00523 බනි 11 සුමනදාස වයිඑම්
- සෙ/310248 ජේඩබ්ලිව්පී බනි 11 අජිත් කුමාර වයිඑම්
- සෙ/360359 ව/සැ සේනාධීර එච්ඩබ් ආර්වීඑස්පී
- සෙ/319054 සැරයන් ආරියරත්න කේවීඑස් ආර්වීඑස්පී

- වයිට් හැකල් ප්‍රකාශන අංශය -



# 65 සේමු සේනාංකාධිපති
## 10 ශ්‍රීලපාහ සංචාරයක

65 වන සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරල් පීආර්වවී ඩයස් යුඑස්පී එන්ඩීසී පීඑස්සී අයිපී යන ජ්‍යෙෂ්ඨ නිළධාරී තුමන් 2015 ජුලි මස 21 දින 10 ශ්‍රීලපාහ ස්ථානගතව ඇති පාලිනගර් යුධ හමුදා කඳවුරේ සංචාරයක් සඳහා පැමිණෙන ලදි. කඳවුරු සම්මාන මුරයක් ද සමගින් අණදෙන නිළධාරි මේජර් ටීකේඩී ධර්මසේන ආර්එස්පී ශ්‍රීලපාහ විසින් එතුමන් ගෞරව බහුමානයෙන් යුතුව පිළිගැණින.

ඒකක සංචාරය සිහිවීම පිණිස කඳවුරු භූමියේ අඹ පැලයක් රෝපණය කළ එතුමන් හරවත් දේශනයක් සිදු කරමින් මෙම ඒකකය උසස් මූලස්ථානයන් වෙතින් ලබාදෙනු ලබන උපදෙස් හා නියෝග නිසියාකාරව පිළිපදින විනය ගරුක ඒකකයක් බව ප්‍රකාශ කරන ලදි. පසුව ක්‍රියාන්විත මැදිරිය වෙත පැමිණ සිවිල් සම්බන්ධිකරණ කටයුතු/ක්‍රියාන්විත රාජකාරි සහ පාලන රාජකාරි සම්බන්ධයෙන් සකසා තිබූ ඉදිරිපත් කිරීමකටද සහභාගී වී සංචාරය නිමාකොට කඳවුරෙන් නික්ම යන ලදී.

# 20 ශ්‍රීලපාහ පුවත්

# උතුම් සමාජ සත්කාරයකට උරදුන් 20 ශ්‍රීලපාහ



මෙම ඒකක බලප්‍රදේශයට අයත් මුක්කම්පන් සින්නපල්ලවරායන්කට්ටු ග්‍රාමයේ නැවත පදිංචි වු සිවිල්වැසියන් විසින් පුදපූජා පවත්වන ලද මුරුගන් කොවිල නිසි නඩත්තුවකින් තොරවීම නිසා ගරාවැටෙමින් තිබිණි. ඒකක අණදෙන නිළධාරී ලුතිතන් කර්නල් අයිපී ජයසිංහ ආර්ඩබ්ලිවීපී ආර්එස්පී ශ්‍රීලපාහගේ නිර්ක්ෂණයෙන් පසු එම කොවිලෙහි පූජකතුමාගේද අවසරයෙන් ඒකකයේ සියලුම නිලයින්ගේ ශ්‍රමදායකත්වයෙන් කෝවිල ප්‍රතිසංස්කරණය කොට එහි ආගමික කටයුතු සඳහා අවශ්‍ය සියලුම දෑ සමගින් 2015 ජුලි මස 16 වන දින ඒකක අණදෙන නිලධාරිතුමාගේ ප්‍රධානත්වයෙන් කෝවිලෙහි පුජකතුමා හා ගම්වාසීන්ගේ සහභාගිත්වයෙන් හින්දු සංස්කෘතික ආගමික චාරිත්‍ර විධි අනුව ... 

# 8 වන බළඇණි දිනය සමරයි













8 වන බළඇණි දින සංවත්සරය 2015 ජුනි මස 25 වන දින 11 ශ්‍රීලපාහ ඒකකයේ අණදෙන නිළධාරී ලුතිතන් කර්නල් වීඩීඑස් පෙරේරා ශ්‍රීලපාහ ප්‍රධානත්වයෙන් පැවැත්වණි. මෙම ඒකක සංවත්සර දිනයට සමගාමීව වැඩ සටහන් රාශියක් සිදු කළ අතර, 2015.06.14 වන දින සිට 2015.06.16 දින දක්වා අත්පන්දු හා ක්‍රිකට් තරගාවලියක් පැවැත්විය. එහිදි අත්පන්දු ශූරතාවය "ඒ" කණ්ඩායම ද, අනු ශූරතාවය අණ සහ පාලන කණ්ඩායම ද ක්‍රිකට් ශූරතාවය "සී" කණ්ඩායම ද එහි අනුශූරතාවය "ඩී" කණ්ඩායමද හිමි කරගන්නා ලදී.

ඒකක ධජයන්ට සෙත්පැතිම සදහා අණ දෙන නිළධාරී ප්‍රමුඛ සියලුම නිලයින් මුස්ලිම් මොහිදින් ජුම්මා පල්ලිය වෙත හා සිවන් කෝවිල ආදී ආගමික දේවස්ථානයක් වෙත ගොස් සෙත් පතා ආශිර්වාද ලාබාගත් අතර, අණදෙන නිළධාරීතුමන්ගේ ආරාධනයෙන් මයිකල් සවේනද්‍රනායගම් පියතුමන් විසින් ඒකක ධජ වලට හා රාජකාරියේ නියතු සියලුම නිලයින්ට සෙත් පතා දිව්‍ය පුජාවක් සිදු කළ අතර, මෙවැනි දිව්‍ය පුජාවක් ඒකකය තුල සිදු කල ප්‍රථම අවස්ථාව මෙය වේ.

තවද බළඇණි සංවත්සර දින අණදෙන නිළධාරීතුමන් හට සම්මාන මුරයක් හා සම්මාන පෙළපාලියක් ලබා දෙන්නට ද කටයුතු සිදු කරන ලදී මෙහිදී අණදෙන නිලධාරී තුමන් විසින් සියලු හට පිරිස් අමතමින් ඒකකය වසර 8 ක් පසු කරමින් ආ ගමන් මග සදහන් කළ අතර, හමුදාව තුල රාජකාරී සිදු කිරිමේදි යුද්ධ හමුදාවේ කීර්ති නාමයට කැළලක් නොවන අයුරින් රාජකාරී කළ යුතු අන්දම සදහන් කරමින් හරවත් කාලෝචිත දේශනයක් පවත්වන ලදී.

ඒකකය සමගින් රාජකාරී කරමින් සිටියදී රට වෙනුවෙන් ප්‍රාණදානය කළ වීරෝධාර රණවිරුවන් 222 ක් හා තුවාල ලබා රෝහල් ගතව සිටින රණවිරුවන් 989 ක් වෙනුවෙන් ආගමික වැඩ සටහනක් සංවිධානය කළ අතර. 2015 ජුනි මස 25 වන දින මියගිය රණවිරුවන්ගේ ලගම ඥාතින් ඒකකය වෙත ගෙන්වා යාපනය අර්ධද්වීපයේ පූජනිය ස්ථාන වන්දනාමාන කිරීමට හා පුණ්‍යානුමෝදනා කටයුතු සිදු කිරීමට අවස්ථාව උදාකර දෙන ලදි. තවද මියගිය රණවිරුවන්ට හා ආබාධිත රණවිරුවන්ට සෙත් පතා ඒකක බුදු මැදුරු පරිශ්‍රය තුළ දී බෝධි පූජා පිංකමක් සිදුකර පසු දින සංඝයා වහන්සේලා සවිපස් නමක් අරභයා සංඝගත දක්ෂිනාවක් පිරිණමන ලදී. මෙහිදී අණදෙන නිලධාරී තුමන් පැමිණ සිටි රණවිරු ඥාතීන් සමග ඔවුන් හට පැනනැගි ඇති ගැටලු පිලිබද සාකච්ඡා කර විසදුම් ලබා දෙන ලදී. එදින සන්ධ්‍යාවේ අණදෙන නිලධාරී තුමන් ඇතුලුව සියලුම නිලයින් ඒකකයේ ෂයින් ඉලවෙන් සංගීතයට එක්විය.

# දැනුමෙන් පුහුණුවෙන් පෙරමුණට



2004.11.07 වන දින කෙඩෙට් නිළධාරියෙකු ලෙස ශ්‍රී ලංකා යුද්ධ හමුදාවට බැදී මූලික කෙඩෙට් පාඨමාලාව කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලයෙන් හදාරා දෙවන ලුතිතන් වරයෙකු ලෙස ශ්‍රීලංකා පාබල හමුදාවට එක් වන මෙම නිළධාරී 2015 මැයි මස 26 වන දින සිට ජුනි මස 01 වන දින දක්වා කාලය තුල පැවති සංග්‍රමික වෙඩිතැබීමේ තරගාවලිය සදහා සහභාගි විය. එම තරගාවලියේ කපිතාන් නිළයේ විවෘත අංශයේ ප්‍රථම ස්ථානයද, විවෘත අංශයේ සියලු වෙඩික්කරුවන් අතර දෙවන ස්ථානයද, කපිතන් නිලයේ ආධුණික අංශයේ ප්‍රථම ස්ථානය ද විවෘත ආධුණික අංශ දෙකෙන්ම සියලු වෙලූක්කරුවන් අතර දෙවන ස්ථානය ද ලබා තරගාවලියේ ජයග්‍රහනය ලබාගන්නා ලදි. දිනෙන් දින දක්ෂතා පෙන්වමින් ඉදිරියට යන මෙම නිලධාරී හට ඒකක අණදෙන නිලධාරී තුමන් ඇතුලු සියලුම නිලයින්ගේ උණුසුම් සුභ පැතුම් පුද කරමු.

# ශ්‍රීලපාහ සේවා වනිතා වත්ති



## රණවිරු හිසට සෙවනක්

පාබල හමුදා සේවාවනිතා ශාඛාවේ මූල්‍ය අනුග්‍රහයෙන් හා 14(සෙව්)ශ්‍රීලපාහ ඒකකයේ ශ්‍රම දායකත්වනේ දෙහිඅත්තකණ්ඩිය සඳුන්පුර ප්‍රදේශයේ සෙ/14ඩී00941 සාසෙ යාපාරත්න වයිඑම්පී රණවිරුවා වෙත නිවහනක් ඉදිකර දෙන ලදී. මෙම නිවහන 2015.07.10 පාබල හමුදා රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් කේවීඩීඒ කරුණාසේකර ආර්ඩබ්ලිව්පී ඩබ්ලිව්ඩබ්ලිව්වී යූඑස්පී එන්ඩියූ පීඑස්සී තුමන්ගේ සුරතින් පරිත්‍යාග කරන ලද අතර, මෙම උත්සවය සඳහා සේවා වනිතා ශාඛාවේ ගරු සභාපතිණිය ධනංජනී කරුණාසේකර මැතිණිය සමග පාබල හමුදා රෙජිමේන්තු මධ්‍යස්ථාන සේනාධිධායක තුමන් හා 14(සෙව්)ශ්‍රීලපාහ ඒකකයේ අණදෙන නිලධාරි තුමන් ද සේවාවනිතා සම්පික සාමාජිකාවන් රැසක් ද සහභාගී විය.

## ලේ දන් දුන් වගයි..





පාබල හමුදා සේවා වනිතා ශාඛාව මගින් ජාතික රුධිර පාරවිලයන ආයතනය සමග එක්ව ලේ පරිත්‍යාග කිරීමේ සමාජ සත්කාරක වැඩමුළුවක් එහි සභාපතිණියගේ ප්‍රධානත්වයෙන් 2015.07.03 දින රෙජිමේන්තු ශ්‍රවණාගාරයේදී පැවැත්විය. සියළුම නිලයින් විසින් වදින ලේ පරිත්‍යාග කිරීම සඳහා සහභාගී වූහ.

## වෛද්‍යාධාර

4 ශ්‍රීලපාහ ඒකකයේ නියුතු සෙ/316533 කෝප්‍රල් කුමාර පීජීඑස් කොනොනිගේ ශ්‍රවණාබාධිත තත්වයෙන් පසුවන දරුවාට වෛද්‍ය ප්‍රතිකාර ලාබාගැනීම සඳහා විශාල මුදලක් වැයවන අතර, මේ පිළිබඳව පාබලහමුදා සේවා වනිතා ශාඛාව වෙත දැනුම් දීමෙන් පසු එහි ගරු සභාපතිණිය ධනංජනී කරුණාසේකර මැතිණිය විසින් 2015.08.19 වන දින රු. 30,000.00 ක වෛද්‍යධාර මුදලක් පරිත්‍යාග කෙරුණි.



## රණවිරු සවිය

පාබල හමුදා රෙජිමේන්තු මූලස්ථාන බළඇණියට අයත් ආබාධිත තත්වයේ පසුවන සෙ/311033 බනි 11 ජනක එච්ඒසී ජ්‍යෙකොනොනි වෙත ඔහුගේ ආබාධිත තත්වයට සරිලන සනීපාරක්‍ෂක කට්ටලයක් 2015.07.03 වන දින සේවා වනිතා ගරු සභාපතිගේ සුරතින් රෙජිමේන්තු මධ්‍යස්ථානයේදී පරිත්‍යාග කෙරිණ.



## ශිෂ්‍යාධාර

2(සෙවී) ශ්‍රීලපාහ ඒකකයට අයත් සෙ/ඩී100635 සැරයන් ගාමිණී නිශාන්ත පීඊපී ජ්‍යෙකොනොනිගේ දියණිය වන පීඒඒ තිලෝචනා දිව්‍යාංජලී පතිරසිංහ 2014 වර්ෂයේ ශිෂ්‍යයත්ව විභාගයෙන් ලකුණ 193ක් ලබාගෙන ගාල්ල දිස්ත්‍රික්කයෙන් ප්‍රථම ස්ථානය හිමිකරගන්නා ලදී. එම දියණියගේ දක්‍ෂතාවය අගයමින් ශ්‍රීලංකා පාබල හමුදා සේවා වනිතා ශාඛාව වෙතින් ලබාදෙන ලද ශිෂ්‍යාධාර මුදල 2015.08.21 වන දින යුද්ධ හමුදාධිපතිතුමන් ගේ සුරතින් පාබල හමුදා රෙජිමේන්තු මධ්‍යස්ථානයේදී පිරිණාමන ලදී.



# රෙම ශ්‍රීලපාහ පන්සලට මුල්ගල තැබීමේ උත්සවය







ශ්‍රී ලංකා පාබල හමුදා පරිශ්‍රයේ නව පන්සල ඉදිකිරීම සඳහා මුල්ගල තැබීම 2015 අගෝස්තු මස 06 වන දිනට යෙදුන සුභ මුහුර්ථයෙන් පාබල හමුදා මධ්‍යස්ථාන සේනාවිධායක බ්‍රිගේඩියර් එම්එම් කිත්සිරි ආර්එස්පී ගේ සුරතින් සිදු විය. මෙම පුණ්‍ය කටයුත්ත සඳහා නියෝජ්‍ය සේනාවිධායක කර්නල් ජීඑම්එන් පෙරේරා ආර්ඩබ්ලිව්පී ආර්එස්පී තුමන් සමඟින් සියලුම නිලයින් සහභාගී විය.

# 1983 ජුලි මස 23

## ත්‍රස්ත ප්‍රහාරයෙන් මියගිය රණවිරුවන් සිහිකිරීම

1 ශ්‍රීලපාහ පුවත්





1983 ජුලි මස 23 වන දින එල්ටීටීඊ සංවිධානය විසින් ඊළාම් ත්‍රස්තවාදය ආරම්භ කරමින් යාපනය තිරුණෙල්වේලි ප්‍රදේශයේ පාමුර සංචාරයක යෙදී සිටි මෙම ඒකක භටපිරිස් වෙත ප්‍රහාරයක් එල්ල කළ අතර, එහිදී ලුතිතන් වාස් ගුණවර්ධන ඇතුලු වීරෝදාර රණවිරුවන් 12 දෙනෙකු ජීවිත පූජා කරන ලදී.

එම සිදුවීම සිදුවී වසර 32 සපිරීම නිමිත්තෙන් ඔවුන් හට පිං පැමිණවීම සඳහා මෙම බළඇණිය විසින් 2015 ජුලි මස 23 වන දින අංක 195/1, වටරුක, ඇල්විටිගල මාවතේ පිහිටි සංහිඳ ළමා නිවාසයට උදෑසන ආහාර වේලක් පිළිගැන්වීමෙන් අනතුරුව එම ළමා නිවාසයේ කුඩා ළමුන්ගේ පරිහරනය සඳහා විදුලි ඕගනයක් පරිත්‍යාග කරන ලදී.

**බුද්ධි අංශය - 1 ශ්‍රීලපාහ**

# ලිපිකරු පාඨමාලාවෙන් ප්‍රථම ස්ථානයට

(සෙවි) ශ්‍රීලපාහ 17 පුවත්

2015 ජුලි මස 27 දින සිට 2015 අගෝස්තු මස 18 වන දින දක්වා කාලය තුළදී ආසේමු (නැ) යටතේ රාජකාරී කරනු ලබන ඒකකයන් නියෝජනය කරමින් ලිපිකරු පාඨමාලා අංක 07 සෙනින් 25 දෙනෙකුගේ සහභාගීත්වයෙන් සේනාංක පුහුණු පාසල 23 සේමුල පුනානි වෙතින් පවත්වන ලදි. එම පාඨමාලාව සඳහා මෙම ඒකකයේ රාජකාරියේ නියුතු සෙ/17ඩී00315 ලාකෝ රත්නපාල TWUT සහභාගී විය. මෙම කොනොනි ඉතා උනන්දුවෙන් හා කැපවීමෙන් පාඨමාලාව ඉතා උසස් අන්දමින් හදාරා පාඨමාලාවට සහභාගීවූ අයදුම්කරුවන් අතරින් පළමු ස්ථානය හම්කර ගැනීමට සමත්විය. තත් කොනොනිගේ මෙම ජයග්‍රහනය ඒකකයට පමණක් නොව ශ්‍රී ලංකා පාබල හමුදා රෙජිමේන්තුවටත් ඉමහත් කිර්තියක් මෙන්ම ගෞරවයක්ද බැවින් අණදෙන නිලධාරී ඇතුලු සියලුම නිලයින්ගේ සුභාශිංසන මෙසේ පිරිණමමු.



# බළඇණි පුහුණු පාඨමාලාව හදාරමින්...







මෙම පාඨමාලාවේ ආරම්භක දේශණය 2015.04.20 දින 21 වන සේනාංකාධිපති මේජර් ජෙනරාල් පීයූඑස් විතානගේ ආර්එස්පී යන ජ්‍යෙෂ්ඨ නිළධාරි විසින් සිදු කරන ලද අතර, ඒකක අණදෙන නිළධාරි ලුතිතන් කර්නල් එස්එන්එම්ඒබී අරබේපොල ශ්‍රීලපාහගේ පූර්ණ අධීක්ෂණය යටතේ ශාරීරික අභ්‍යාස, යුධ උපක්‍රම, අභ්‍යන්තර ආරක්ෂක රාජකාරි, අවි පුහුණුව, පීව වෙඩි තැබීම් (දිවා/රාත්‍රී), සිතියම් කියවීම, නීති විරෝධී රැස්වීම් විසුරුවා හැරීම, වනයේ ලැගුම් ගැනීම, නගරබද සටන්, රැකසිට පහරදීම්, වෙහෙසකර පා ගමන් හා විවිධ දේශණ තුලින් ලද දැනුම හා ප්‍රායෝගික පුහුණුව තුලින් කණිෂ්ඨ නායකයින්ගේ නායකත්ව ගුණාංග වර්ධනය කරගන්නා ලදි. පුහුණුවීම් සිදුකරන අතරතුර එළඹි වෙසක් පොහොය නිමිත්තෙන් 2015.05.02 දින පුහුණු පාසල තුලදී මහා බත් දන්සලක් ද පැවැත්විය.

සමස්ත පාඨමාලාවේ දක්ෂතම කණ්ඩායම ලෙස "ඒ" කණ්ඩායම ද, දක්ෂතම නිලධාරි ලෙස නි/67420 කපිතන් එච්එම් රාජපක්ෂ ආර්එස්පී ශ්‍රීලපාහ ද, දක්ෂතම කණ්ඩභාර නිලධාරි නි/69265 ලුතිතන් කේටීඩීකේඑස් ජයපාල ශ්‍රීලපාහ ද, ශාරීරික යෝග්‍යතාව අතින් දක්ෂතම සෙබලා ලෙස සෙ/331885 සාසෙ රූපසිංහ ඩබ් ද, දක්ෂතම වෙඩික්කරු ලෙස සෙ/316766 සැරයන් කීර්තිරත්න කේපී ද, දක්ෂතම ජ්‍යෙකොනොනි සෙ/306421 බනි 11 ජයසුන්දර ජේඑම්ඩී ද, දක්ෂතම කොනොනි ලෙස සෙ/325126 ලාකෝ සංජීව කේඑම් සහ දක්ෂතම සාමාන්‍ය සෙබලා ලෙස සෙ/555209 සාසෙ ප්‍රියන්ත ජේඑම් පුහුණු පාසලේ ප්‍රධාන උපදේශක හා 213 බලසේනාවේ බලසේනාධිපති වන කර්නල් එච්එම්ඩබ්ලිව් හේරත් ආර්එස්පී යන ජ්‍යෙෂ්ඨ නිළධාරි අතින් සහතික පත් හා කුසලතා සම්මාන ලබාගන්නා ලදි.

පාඨමාලාවේ සමාප්තිය සටහන් කරමින් 2015.06.13 දින පුහුණු පාසලේ උපදේශක මඩුල්ල හා පාඨමාලාවේ සියලුම සිසුන් සහභාගීත්වයෙන් ඒකක සංගීත කණ්ඩායමේ සත්සර නාදයට 4 වන කාන්තා බලකා නර්ථන කණ්ඩායමේ නර්ථනයද මුසුකොට ඉතා විචිත්‍රවත් සමුගැනීමේ උත්සවයක් පවත්වා බළඇණි පුහුණු පාසලට සමුදෙන ලදි.

සාමූහික පුහුණුවීම් තුලින් ලබාගන්නා ලද දැනුම ඒකකයට පැවරෙන රාජකාරීන් වඩාත් කාර්යක්ෂමව හා ඵලදායී ලෙස ඉටුකිරීමට ඉමහත් අත්වැලක් වන බැව් මෙම පාඨමාලාවේදී ලද දැනුමින් පසක් විය.

**බුද්ධි අංශය-24 ශ්‍රීලපාහ**





# සිතක සේයා

## සෙබල සිතක සිතිවිලි...

### අවවාදය සමඟ ආදර්ශයෙන් පෙරට යන්න

තම මිතුරන් හට සමාජයේ හොඳ පුරුදු කියා දෙන්න
තමන්ද ඔවුන් හට ආදර්ශයක් ලෙසට කටයුතු කරන්න
තම අනුගාමිකයන්හට නිවැරදි දේ පමණක් කියා දෙන්න
එවිට ඔබට හැකිවේවි ඔබගේ අරමුණු සතුටින් ජය ගන්න

සෙ/326740 ලාකෝ සුදත් කුමාර ආර්ඒ
ප්‍රවාහන අංශය 8 ශ්‍රීලපාහ

### මට වැරදුණු තැන.........

වේයා තුඹස සාදයි නිසි වෙලාවට
මියා නටයි පූසා නැති වෙලාවට
මිතුරන් සිටියි අත මිට සරු වෙලාවට
කවුරුත් නොමැත මට වැරදුණු වෙලාවට...........

සෙ/18ඩී00689 සාසෙ බණ්ඩාර ආර්එම්පීඑස්
18 (සෙව්) ශ්‍රීලපාහ ''සී'' කණ්ඩායම

### උගස



ගෙදර එන ගුරු පාර
අමතක වී තිබුණු
දයාබර මගුල් මුද්ද
බැංකු සිර අඩස්සියෙන්
නිදහස් වී
ගෙදර ඇවිත්

මේජර් ඒඩී ගුණරත්න ආර්එස්පී ශ්‍රීලපාහ

### "මල"



පුදන්නට,කඩන්නට
කම් නැත,පනින්නට
උරන්නට,හොඳ නැත

### සෙබල හිත



දෙමාපිය සෙනෙහසට
දරුවන්ද ප්‍රිය බිරිය
අමතකව නුබ ගිහින්
රුදුරු මහ ගණ
වනන්තරේ...............
හිණි අවිය අත දරා
සතුරන්ය බිය නොවී
ජීවිතයක් මරණයක්
යෙහෙකැයි සිතා...........................
රම් දැය රැකගන්න
නොබියමම ඉදිරියට............
කොතරම්ම සවි ඇත්ද
ඒ පුංචි සෙබල හිත.............
සදාකල් ණය ගැතියි
එනිසාම අප ඔබට
විරුවාණ...............

සෙ/328623 ලාකෝ සේනෙවිරත්න බීඩබ්ඇයිබී
භාර්‍යා ඉනෝකා නිශානි විරසූරිය

### සිහිනයකි නුඹ

සිහිනයක් ඔබ හැදාම මට
මිරිගුවකි ඔබ මගේ දෑස රවටන
කඳුලකි ඔබ මගේ නෙත් තෙමනා
හැමදාම හිදමි මා
මගේ නෙත් අයාගෙන

ඔබට ලංවී ඉන්නට නෑ වරම් මට
ඔබේ කට හඬ පමණි මට උරුම
ආදරයෙන් මා අමතන්න හැමදාම
වරම් දෙන්නෙ කවදා ද ඔබ මට

සෙ/323606 කෝප්‍රල්
සඳරුවන් ඩබ්ඩීසී
අණ සහ පාලන කණ්ඩායම
15 ශ්‍රීලපාහ

### පිය නෙහසට කවි ගී ලියැවුනා මිදී

සිය පණ දෙවැනි කොට සැලකූ   බිරින්දෑට
ආදර සෙනෙහෙ බර පැටවුන්   කැදැල්ලට
තනිකර දමා ඔබ ගියෙ යුද   කරන්නද
නිවහල් රටක් අප හට හිමි   කරන්නද

දිව රෑ වෙහෙස විඳ සතුරන් සමග   ගැටී
උපයන මුදලු කහවණු රන් පවුම්   වටී
සරුවු හමුත් අප දිවි ඒ මුදලෙ   ගැටී
වැලපෙයි සැමොම මේකද දෛවයේ   හැටී

එඩිතර හදක් ඇති රණවිරු   පියාණෙනි
වෙඩි උණ්ඩයට ඔබෙ හදවත නිමා   වුනි
රටවෙනුවෙන්ම දිවි පිදූ මගෙ   පියාණෙනි
මතු බුදුවෙන්න වදිනෙමි මම   දයාවෙනි

ඔබ නැති අඩුව මගෙ නංගිගෙ   හදවතට
දැනුනා තදින් සිත පාර යන   ලෙසට
ඇගෙන් වැටෙන හැම දුක්බිඳු   කඳුලකම
ඔබ නැති අඩුව ලියැවී තිබුණා   ලෙසට

ඔබ නැති අඩුව අප සිතතුල දැවෙන   විට
අප ලග සිටියෙ අපෙ අම්මා පමනි   හද
ඔබගේ රුව අප සිත තුල මැවෙන   විට
තනිකම දැනෙයි මුලු ලෝකය අඳුරු   කොට

ඒ අඳුරේම අප ඉගෙනුම ලබන   විට
පහනක් වෙලා ඔබ එනවදා අප   ලගට
ඒ එලියෙන් අප ලෝකය   දිදුලනට
දෙනවද ඔබේ වටිනා   ආශිර්වාද

කේ එමෝද්‍යාරශ්මි මියගිය පියා වෙනුවෙන් කල උපහාර කවියකි
සෙ/311902 සැරයන් කොට්ටලගේ කේඒඑස් ආදරණිය දියණිය.
බුද්ධි අංශය 11 ශ්‍රීලපාහ

### මගේ දුවට...



අවුරුද්දක් සපිරෙන්නට
ලග එයි දින ඔබට දුවේ
නොනිමෙන සතුටක් දැනේ
නුඹේ අම්මට චූටි දුවේ.............

මගේ ලොවේ හිරුත් ඔබත්
සඳුත් ඔබයි රත්තරං දුවේ
ඒ හිරු සඳු බබලවන්නට
මා වෙහෙසෙමි දිවා රැයේ.............

මගේ දෝණි ලොව දිනනා
දින දැකගන්නට ආසයි
ඒ දින එනතුරු
නොපියෙන්නයි මගේ නෙත්
පැතුමින් පතනෙමි නිරතුරු...............

සෙ/18ඩී00215 ලාකෝ තිස්ස-කුමාර ඩබ්එම්
18 (සෙව්) ශ්‍රීලපාහ "ඩී" කණ්ඩායම

### නුඹ මල් ගොමුවකි අම්මේ



මහමෙර තරම් දරුදුක හද   පත්ලේ
උතුලන මව් පියන් සැමදා දුක්   ගින්නේ
කිසිවක් නෑ හදේ කකියන ලේ   ගොන්නේ
දරු සෙනෙහස පමණි උතුරා පිට   පැන්නේ

නව දරු මවක් වු දින මගෙ සඳු   අම්මේ
දරුවන් තුරුළු කරගෙන සැනසුන   අම්මේ
පිරිමි පුතුන් හතරක් නුඹ වැදු   අම්මේ
පූජා කලා රට රැකුමට සුදු   අම්මේ

පුතුන් හතරදෙන අද   ආබාධිතය
හැදූඩු මව්ගෙ හදවත අද   ඔත්පලය
වීර පුතුන් වැඩු නුඹ අද   ඔත්පලය
හිනැගෙන් මගෙ අම්මේ නුඹ මල්   ගොමුවක්ය

සෙ/323207 සාසෙ අමරතුංග ඒඑම්
අණ සහ පාලන කණ්ඩායම 20 ශ්‍රීලපාහ

### විරුවානෙනි ඔබට තැනක් ඇත

නිළඇඳුමට නුඹෙ සිත පෙම්   බැන්දාට
පෝලිමේ ඇවිත් හමුදාවට   බැඳුනාට
පැය විසිහතරෙ සේවයේ ඔබ   යෙදුනාට
රටවැසියනි පුදවු අපේ රණ   විරුවන්ට

සෙ/312919 කෝප්‍රල් ප්‍රේමසිරි ඒඒ
ප්‍රවාහන අංශය 8 ශ්‍රීලපාහ

### සිතුවිල්ල නැමැති පැළෑටිය

අපි පැළෑටියක් රෝපණය කරන්නේ
මහත් බලාපොරොත්තු තබාගෙනය
එම බලාපොරොත්තු හොඳ හෝ නරක විය හැක
සමහරවිට එල සහිත විය හැක
සමහරවිට එල රහිත විය හැක
සමහරවිට විෂ සහිත විය හැක
සමහරවිට මාරාන්තික විය හැක
සිතුවිල්ල නැමැති පැළෑටිය තම හිත තුළ
රෝපණය කරන විට
දෙවරක් සිතා බලා රෝපණය කරන්න
එවිට ඔබ හට සදා කාලික සෙවන ලැබේ
සැකසුම :
සෙ/321481 ලාකෝ ප්‍රබෝධන ඒඑස්
අණ සහ පාලන කණ්ඩායම 8 ශ්‍රීලපාහ

### සුපෙම් සඳ නුබය



විටක මා සිත ද නෙතු ද
විශ්මයට පත් කරමින්.............
විටක මා දිවියට අමා පහන්
ඔවදන් දෙමින්............
විටක මා හද
තුටු සතුටු කරමින්...............
විටක මා නෙතු
අගට කදුලක්
එක් කරමින්...............
විටක මා ගත සිත
සෙනෙහසින්
වෙලා ගනිමින් ...............
මගේ ලොවට
පැයු සුපෙම් සඳ නුබයි.............
මා රැකවරණය
නුබයි.............සඳා..............

සෙ/326133 ලාකෝ ඉරංග එච්එච්ඩීඑස් ගේ
ආදරණිය ඩිරිඳු එස්යු තරංගි




# 4 ශ්‍රීලපාහ පුවත්

## කෙළිබිම ජයගත් 4 ශ්‍රීලපාහ ක්‍රීඩා ශූරයෝ

යුද පිටියේ පමණක් නොව ක්‍රීඩා පිටියේද දක්ෂතාවය විදහාපාමින් 2015 අන්තර් ඒකක ක්‍රීඩා තරගාවලියේ ලකුණු 107 ක් ලබාගනිමින් ශූරතාවය හිමිකර ගැනීමට සමත් වූ මෙම ඒකකය ශ්‍රීලපාහ රෙජිමේන්තුවේ හොදම බළඇණිය ලෙස කිරුළ පැළදීමට සමත්විය. අණදෙන නිළධාරී ලුතිතන් කර්නල් ජේකේආර්පි ජයසිංහ ආර්ඩබ්පි ආර්එස්පි ශ්‍රීලපාහ යන නිලධාරී තුමන්ගේ නිසි මග පෙන්වීම තුලින් ඒකකයේ සියලුම නිලධාරී හා සෙසුනිලයින්ගේ එකමුතුවෙන් සියලු අභියෝග පරදා මෙම ශූරතාවය ලබාගෙන තම ඒකකයේ අභිමානය ඔසවා තැබීමට සමත් විය.

## ඒකකය ලබාගත් ජයග්‍රහන

| අංකය | නිලය | නම | දක්ෂතාවය |
|---|---|---|---|
| සෙ/319603 | ලාකෝ | වණසිංහ කේපී | මී 800 රන් පදක්කම |
| සෙ/331199 | ලාකෝ | සුරංග එච්එම්සී | මිටිය විසිකිරීම රන් පදක්කම |
| සෙ/331199 | ලාකෝ | සුරංග එච්එම්සී | යගුලිය විසිකිරීම රන් පදක්කම |
| සෙ/323078 | සාසෙ | තිස්ස කුමාර ඩබ්ඩී | මී 3000 බාදක දිවීම රන් පදක්කම |
| සෙ/324732 | ලාකෝ | කමල් කුමාර ආර්එම් | කවපෙත්ත විසි කිරීම රිදී පදක්කම |
| සෙ/2069225 | ආසෙ | මහයාග පීඑස් | මී 5000 රිදී පදක්කම |
| සෙ/2069225 | ආසෙ | මහයාග පීඑස් | මී 1500 රිදී පදක්කම |

**සහය දිවීම**

සෙ/318377 කෝප්‍රල් ප්‍රේමකුමාර ඩබ්එස්
සෙ/318915 කෝප්‍රල් පුෂ්පකුමාර ඩීඑස්
සෙ/31963 ලාකෝ වණසිංහ කේපී
සෙ/323078 සාසෙ තිස්ස කුමාර ඩබ්ඩී
} රන් පදක්කම

බුද්ධි අංශය 4 ශ්‍රීලපාහ

## කිලෝ ග්‍රෑම් 66ක් බර ඔසවා රිදී පදක්කම දිනයි






**සෙ/317655 ලාකෝ චතුර කුමාර අයිඑල්**
කිලෝ ග්‍රෑම් 66 බර පන්තිය
රිදී පදක්කම

විවෘත සවිබර ඉසිලීමේ තරගාවලිය 2015 අගෝස්තු මස 01 දින පවත්වන ලදී. හොරණ බණ්ඩාරගම මෛත්‍රී ශාලාවේදී පවැත්වීය.

මෙම තරගාවලියට ශ්‍රී ලංකා යුධ හමුදා සංචිතයේ ක්‍රිඩකයින්ද සහභාගිවූ අතර, ඉන් ශ්‍රී ලංකා පාබල හමුදා සංචිතයෙන් ඉදිරිපත් වූ මෙම ඒකකයේ සෙ/317655 ලාකෝ චතුර කුමාර අයිඑල් එම තරඟාවලියේ කිලෝ ග්‍රෑම් 66 බර පන්තිය පවර් ලිෆ්ටින් තරඟ ඉසව්වෙන් රිදී පදක්කමද, බෙන්ච් වෙස් තරඟ ඉසව්වට සහභාගිවී දෙවන ස්ථානයට හිමි කුසලානය ලබාගන්නා ගන්නා ලදී. මෙම ජයග්‍රහනය අප ඒකකයට පමණක් නොව ශ්‍රී ලංකා පාබල හමුදා රෙජිමේන්තුවටත් සහ සමස්ථ යුධ හමුදාවම ලබාගත් ජයග්‍රහණයක් ලෙස අප මතක් කර සිටින්නේ ඉතාමත් ආඩම්බරයෙනි.

බුද්ධි අංශය 4 ශ්‍රීලපාහ

15 ශ්‍රීලපාහ පුවත්

# බළඇණි පුහුණුවීම්
## BATTALION TRAINING





තාවුල්වැව බළඇණි පුහුණු පාසලේ දී 2015.05.06 දින 15 ශ්‍රීලපාහ ඒකකය බළඇණි පුහුණුවීම් ආරම්භ කරන ලදී. මෙම පුහුණු පාඨමාලාව ආරම්භයේ සිට අවසානය දක්වා ඒකකයේ සියලුම අයවලුන් වෙත මනා පුහුණුවක් ලබාදීමට ඒකක අණදෙන නිලධාරි ලුතිතන් කර්නල් එන්පීකේ ගුණසේන ශ්‍රීලපාහ විසින් නිරන්තරයෙන් පුහුණුවීම් කටයුතු පිළිබඳ අධ්‍යයනය කරමින් හටපිරිස් න්‍යායාත්මක දැණුම හා ප්‍රායෝගික දැණුමෙන් වර්ධනය කිරීමට උපදෙස් ලබාදෙන ලදී. අණදෙන නිලධාරීගේ අරමුණ සාක්ෂාත් කරගැනීම සඳහා දෙවන අණදෙන නිලධාරි ඇතුළු සියළුම නිලධාරීන් හා රෙජිමේන්තු සැරයන් මේජර් ඇතුළු සියළුම ජ්‍යෙෂ්ඨ නොනිලධාරීන් විසින් නිරන්තරයෙන් අඩුපාඩු සොයා බලා සියලුම දෙනා දිරිමත් කිරීම පැසසිය යුතු කරුණකි.

පාඨමාලා ආරම්භයේ සිට මහත් උනන්දුවකින් හා කැපවීමකින් යුතුව හටපිරිස් ශාරීරික යෝග්‍යතා පරීක්ෂණ, විවිධ දේශණ සහ ප්‍රායෝගික පුහුණුවීම්, කොම්පාසු සංචාර, මාර්ග බාධක, බාධක තරණ, වෙහෙසකර පා ගමන් යන විෂයන්ට අමතරව ජීව වෙඩිතැබීම් ද ඉතා සාර්ථකව සිදු කළහ.

මෙම පාඨමාලාවේ දක්ෂයන් අතර විශිෂ්ටයන් ඇගයීමේ කුසලාන පිරිනැමීම 221 වන බලසේනාධිපති කර්නල් ඩීඑම්ය්‍යු බණ්ඩාර ආර්එස්පී විසින් සෑම අතින්ම අතිශූර ශිෂ්‍යයා ලෙස ලුතිතන් ඒකේපීපීඑස්ජේ දිසානායක ශ්‍රීලපාහ, හොදම ශාරීරික යෝග්‍යතාවය සඳහා ලුතිතන් පීඩීසී කණ්ඩම්බි ශ්‍රීලපාහ හා හොදම වෙඩි තබන්නා ලෙස සාසෙ කුමාරසිරි ඩීඑම්පී යන අයවලුන් ත්‍යාග ලැබූහ.

2015.07.29 වන දින පාඨමාලාවේ අවසන් අදියර වශයෙන් ප්‍රාසාංගික අත්දැකීමක් ලබාදෙමින් සංගීත සැදෑවක් පැවැත්වූ අතර එහිදී 22 සේනාංකාධිපති, 224 බලසේනාධිපති, 221 බලසේනාධිපති හා සේනාංකයට අයත් ඒකක වල අණදෙන නිලධාරීන්, පුහුණු පාසලේ ප්‍රධාන උපදේශක ඇතුර් උපදේශක මඩුල්ල හා ඒකකයේ සියලුම අයවලුන් සහභාගි වන ලදී.

බලඇණි පුහුණු පාසලෙන් ලැබූ දැණුම් සම්භාරයට කෘතුගුණ සැළකීමක් ලෙස පාඨමාලාවට සහභාගි වුවන් විසින් නිලධාරි නිවස්නය සඳහා රූපවාහිනි යන්ත්‍ර රදවනයක්,දේශන ශාලාව අසල ජල ටැංකියක්, සෙසුනිල භෝජනාගාරය සඳහා ජල කරාම පද්ධතියක් සහ කෑම මේස 05ක් ලබාදෙන ලදී.

බුද්ධි අංශය 15 ශ්‍රීලපාහ

# ශ්‍රීලපාහ අන්තර් ඒකක ආධුනික පාපැදි තරඟාවලියේ ජය 8 ශ්‍රීලපාහට

8 ශ්‍රීලපාහ පුවත්



අන්තර් ඒකක ආධුනික පාපැදි ධාවන තරගාවලිය 2015 අගෝස්තු මස 25 වන දින රෙම ශ්‍රීලපාහ පාපැදි ධාවන සංවිතයේ සභාපති ලුතිතන් කර්නල් එල්එච්සීආර් සිරිවර්ධන ආර්එස්පී ගේ පූර්ණ අධීක්ෂණයෙන් පැවැත්විය. මෙම පාපැදි ධාවන තරඟය මුලතිව් මුල්ලියාවේලි 4 ශ්‍රීලපාහ ඒකකය අසලින් ආම්භ වී ඒ 34 මාර්ගයේ මුලතිව්, ඔඩ්ඩුසුඩාන්, මාන්කුලම්, කොකාවිල්, මුරුක්කන්ඩි හා කිලිනොච්චි තොණ්ඩමන්නගර් හරහා කිලිනොච්චිය දක්වා කිලෝමීටර් 75 දුරක් ගෙවා අවසන් විය. තරගය සඳහා ශ්‍රීලපාහ ඒකක 23 ක පාපැදි ධාවකයින් 38 දෙනෙකු සහභාගි විය.

**තරගකරුවන් ලැබූ දක්ෂතාවයන්**

| | | | |
|---|---|---|---|
| 1 වන ස්ථානය | සෙ/332446 සාසෙ සම්පත් කේඑම්එල් | 8 ශ්‍රීලපාහ | රු: 5000.00 |
| 2 වන ස්ථානය | සෙ/332440 සාසෙ දිසානායක ඩීඑම්එල්ඩබ් | 8 ශ්‍රීලපාහ | රු: 4000.00 |
| 3 වන ස්ථානය | සෙ/332432 සාසෙ නන්දසිරි එස්එච්කේඩී | 8 ශ්‍රීලපාහ | රු: 3000.00 |
| 4 වන ස්ථානය | සෙ/332428 සාසෙ සේනානායක බංඩා ඒඑම් | 8 ශ්‍රීලපාහ | රු: 2000.00 |
| 5 වන ස්ථානය | සෙ/332005 සාසෙ සංජීව කුමාර එන්එම් | 24 ශ්‍රීලපාහ | රු: 1000.00 |

**කණ්ඩායම් අනුව දක්ෂතාවයන්**

| | |
|---|---|
| 1 වන ස්ථානය | 8 ශ්‍රීලපාහ |
| 2 වන ස්ථානය | 4 ශ්‍රීලපාහ |
| 3 වන ස්ථානය | 5 (සෙව්) ශ්‍රීලපාහ |
| 4 වන ස්ථානය | 14 (සෙව්) ශ්‍රීලපාහ |
| 5 වන ස්ථානය | 7 ශ්‍රීලපාහ |

# රෙජිමේන්තු අධිපති ගේ 15 ශ්‍රීලපාහ සංචාරය



''සේවය කරමි'' යන ආදර්ශ පාඨය පෙරටු කරගනිමින් 224 බළසේනා මුලස්ථානයට අනුයුක්තව රාජකාරි ඉටුකරනු ලබන 15 ශ්‍රීලපාහ ඒකකයේ සංචාරයක් රෙජිමේන්තු අධිපති විසින් 2015 අප්‍රේල් මස 09 සිදුකරන ලදී. එම අවස්ථාවට රෙජිමේන්තු මධ්‍යස්ථානයේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් ද සහභාගී වූහ.

මෙදින 1730 පැයට පමණ මේජර් ජෙනරාල් කේඩීඒ කරුණාසේකර ආර්ඩබ්ලිව්පී යූඑස්පී එන්ඩීයූ පීඑස්සී වෙත පසුකර යාමේ කඳවුරු මුරයක් පිරිනමන ලදී. ඒකක අණදෙන නිලධාරි ලුතිතන් කර්නල් එන්පීකේ ගුණසේන ශ්‍රීලපාහ ඇතුලු සියලුම අයවලුන් විසින් අභිමානයෙන් යුතුව එතුමන් පිළිගන්නා ලදී. රෙජිමේන්තු අධිපති වෙත බළලත් නිලධාරි සහ සැරයන් නිවස්නයෙන් තේපැන් සංග්‍රහයක් ලබාදීමෙන් පසු අඹ පැළයක් රෝපණය කරන ලදී. අණදෙන නිලධාරි විසින් ඒකකය තුල දැනට කරනු ලබන රාජකාරි පිළිබඳව දැනුවත් කිරීමෙන් අනතුරුව රෙජිමේන්තු අධිපති ඒකක භටපිරිස් අමතන ලදී. නිලධාරි නිවස්නය වෙතින් රාත්‍රී භෝජන සංග්‍රහයක් ද එතුමන් වෙත ලබා දීමෙන් පසු අමුත්තන්ගේ සටහන් පොතෙහි සටහනක් තබමින් ඒකකයෙන් නික්ම ගියේය.

**බුද්ධි අංශය**

## ශ්‍රීලපාහ අන්තර් ඒකක අනුශූරයෝ

**ශ්‍රීලපාහ අන්තර් ඒකක මලල ක්‍රීඩා තරඟාවලියේ දී අනු ශූරතාවය රෙජිමුඛ ශ්‍රීලපාහට හිමිවිය. යුද පිටියේ ජයග්‍රහනය ලබාගැනිමට උරදී එහිදී ආබාධයට ලක්වූ රණවිරුවන් 2015 අන්තර් ඒකක මලල ක්‍රීඩා තරඟාවලියේදී අනෙකුත් හා සමග උරෙන්උර ගැටී තමන්ගේ ආබාධිත තත්ත්වය හමුවේ වූවද මෙම ජයග්‍රහනය ලැබීම ඒකකය වශයෙන් විශාල ආඩම්බරයකි, අභිමානයකි. මෙම විජයග්‍රහනය කරා ඒකක වෙනුවෙන් ක්‍රීඩා කළ සියලුම ක්‍රිඩකයින්ට මෙන්ම ඔවුන්ව දිරිමත් කළ ඒකක අණදෙන නිලධාරි ඇතුලු සියලුම අයවලුන් මේ මොහොතේ සිහිපත් කරන්නෙමු. මෙවැනි ජයග්‍රහන තවතවත් හිමිකරගැනීමට මෙම ආබාධිත රණවිරුවන්ට ශක්තිය හා ධෛර්ය ලැබේවායි ප්‍රාර්ථනා කරමු.**



# නවතමයෙන් ඉදිවූ ශ්‍රීලපාහ රෙජිමේන්තු කොනොනි සමාජ ශාලාව

# යුද්ධ හමුදාධිපති සුරතින් විවෘත වූ වගයි




JOURNAL OF THE SRI LANKA LIGHT INFANTRY
85th Issue 1994-2015

ශ්‍රී ලංකා පාබල හමුදා රෙජිමේන්තු පරිශ්‍රයේදී ඉදිකරන ලද නවීන අංගෝපාංගයන්ගෙන් සමන්විත ශ්‍රීලපාහ රෙජිමේන්තු කොනොනි සමාජ ශාලාව 2015 අගෝස්තු මස 21 වන දින යුද්ධ හමුදාධිපති ලුතිතන් ජෙනරාල් ඒඩබ්ජේසී ද සිල්වා ආර්ඩබ්පී යූඑස්පී එන්ඩීයූ පීඑස්සී සුරතින් උත්සවත්ශ්‍රීයෙන් විවෘත කෙරිණ. රෙජිමේන්තු පරිශ්‍රයට සපැමිණි යුද්ධ හමුදාධිපතිතුමන් පාබල රෙජිමේන්තු මධ්‍යස්ථාන සේනාවිධායක බ්‍රිගේඩියර් එම්එම් කිත්සිරි ආර්එස්පී විසින් පිළිගැනීමෙන් අනතුරුව ඉතාමත් විශිෂ්ට අන්දමින් සම්මාන පෙළපාලියක් එතුමන් වෙත පුද කරන ලදී.

වසර කීපයක් තුල පාබල හමුදා රෙජිමේන්තු පරිශ්‍රය තුල සංවර්ධන සැළසුම් ක්‍රියාත්මක වෙමින් පවතින අතර නව සැළැස්මක් මත ඉදි කෙරුණු මෙම දෙමහල් ගොඩනැගිල්ල ඉන් එක් සංවර්ධන සැළැස්මකි. අලුතින් ඉදිකෙරුණු මෙම සමාජ ශාලාවෙහි එක් වරකට කොනොනීන් 175 කට පමණ ඔවුන්ගේ කටයුතු ඉතාමත් උසස් අන්දමින් සිදුකරගැනීමේ හැකියාව ලබාදී ඇත.





























# අන්තර් රෙජිමේන්තු ආබාධිත පැරා තරඟාවලිය 2015
## ශූරතාවය රෙජිමේන්තු මූලස්ථාන බලඇණිය ශ්‍රීලපාහ විසින් හිමිකරගනියි

යුද්ධ හමුදා පැරා තරගාවලියේ වසර 10 ක් පුරාවට නොකඩවා ශූරයින් ලෙස අභිමානයක් එක්කලාවු රෙජිමේන්තු මූලස්ථාන බළ ඇණිය ශ්‍රී ලංකා පාබල හමුදා ක්‍රීඩා කණ්ඩායම 2011 වසරේ සිට 2013 වසර දක්වා සමස්ථ ශූරතාවලියේ සහ මළල ක්‍රීඩා ශූරතාවලියේ අනු ශූරයන් බවට පත්වුයේ සියලු ක්‍රීඩකයින් නොසිතූ විරූ ලෙසය. එසේ පුරා වසර 3 ක් ගිලිහිගිය ශූරතාවය නැවත ලබා ගැනීම ලෙහෙසි පහසු කරුණක් නොවුනද 2014 වසරේදී එවකට අණදෙන නිලධාරි වශයෙන් කටයුතු කල කර්නල් එම්වීආර් ගුණසේකර ජ්‍යෙෂ්ඨ නිලධාරි තුමන්ගේ උපදේශකත්වයෙන් යුතුව මලල ක්‍රීඩා ශූරතාවලිය තමන් සතු කර ගැනීමට රෙජිමුඛ ශ්‍රීලපාහ ක්‍රීඩා කණ්ඩායමට හැකිවිය.

2015 වසරේ රෙජිමුඛ ශ්‍රීලපාහ ක්‍රීඩා කණ්ඩායම තම ක්‍රීඩා කටයුතු ආරම්භ කරනු ලබන්නේ නව අණදෙන නිලධාරි ලුතිතන් කර්නල් ඒසිජේ වාසගේ නිලධාරි තුමන් යටතේය. ආරම්භයේ සිටම ක්‍රීඩාභාර නිලධාරි කපිතන් වීපීඑස්අයිඑස්වී ගමගේ ශ්‍රීලපාහ ප්‍රමුඛ ක්‍රීඩා කණ්ඩායම මනාව සංවිධානය වූයේ ජයග්‍රහණයේ බලාපොරොත්තු සහිතවයි.

තම ඒකකයේ අභිප්‍රායන් මුදුන්පත් කරගැනීම සඳහා ආබාධ සහිත වූ ක්‍රීඩකයින් තම ආබාධිත තත්ත්වයන් පසෙකලා ඉතා කැපවීමෙන් වෙහෙසකරවු පුහුණු කටයුතු සඳහා යොමුකරවුයේ ගාල්ල දිස්ත්‍රික් ක්‍රීඩා පුහුණු උපදේශක එස් නිරෝෂන් චන්දිමාල් මහතා සහ පිහිණුම් කටයුතු පුහුණුකරු ජයන්ත ජයවර්ධන මහතාගේ අනුපමේය අධීක්ෂණය යටතේයි.

2015 වසරේ සැප්තැම්බර් 16, 17 සහ 18 යන තෙදින තුල දියගම මහින්ද රාජපක්ෂ ක්‍රීඩාංගනයේ පැවති XVIII වන යුද්ධ හමුදා පැරා තරඟාවලියේ මළල ක්‍රීඩා ශූරතාවයත්, තරගාවලියේ සමස්ථ ශූරතාවයත් දිනා ගනිමින් පාබල මැණියන් රණින් බැබලවීමට රෙපිමුඛ ශ්‍රීලපාහ ක්‍රීඩා කණ්ඩායම කටයුතු කරන ලදී ඒ ප්‍රතිවාදී ක්‍රීඩා කණ්ඩායමට වඩා ලකුණු 47 ක් ඉදිරියෙන් සිටිමිනි.

ක්‍රීඩා කටයුතු ආරම්භයේ සිටම පැරා ක්‍රීඩා තරගාවලියේ ජයග්‍රහණය උදෙසා අප ක්‍රීඩා කණ්ඩායම දිරිමත් කරවු, ආශිර්වාද කරාවු රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරල් කේඒඩීඒ කරුණාසේකර ආර්එස්පී යුඑස්පී එන්ඩීයු පීඑස්සී තුමාත්, පාබල හමුදා සේනාවිධායක තුමා සහ නියෝජ්‍ය සේනාවිධායක තුමා හදපිරි සතුටින් සිහිපත් කරන අතර, අධිෂ්ඨානයෙන් සහ කැපවීමෙන් ඕනෑම ජයග්‍රාහි කඩඉමක් පසුකල හැකි බැව් පසක් කරමින් 11 වන වරටත් පැරා තරගාවලියේ කිරුළ දිනා ගැනීමට කටයුතු කල රෙජිමුඛ ශ්‍රීලපාහ ක්‍රීඩා කණ්ඩායම තව තවත් ජයග්‍රහණ ලබා පාබල මැණියන් බැබලවීමට අවශ්‍යය ශක්තිය ධෛර්යය ලැබේවායි ඉත සිතින් ප්‍රාර්ථනා කරමු.

**මූලස්ථානය රෙජිමුඛ ශ්‍රීලපාහ**



# 6 වසරක අභිමන්

## 23 ශ්‍රීලපාහ පුවත්





අණදෙන නිලධාරි ලුතිතන් කර්නල් එස් විජේසිරිවර්ධන ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ශ්‍රීලපාහ ගේ ප්‍රධානත්වයෙන් 2015.07.23 වන දින 23 ශ්‍රීලපාහ ඒකකයේ හයවන බළඇණි සංවත්සරය ඉතාමත් අභිමානයෙන් යුතුව සැමරිය. සර්ව ආගමික වතාවත්වලට මුල් තැන දෙමින් ඒකකයේ සියලුම නිලයින්ගේ සහභාගිත්වයෙන් පැවැත්වුණු අතර, 2015.06.27 වන දින කතරගම පූජා භූමියේදී ඒකක ධජයන්ට සෙත් පතා ආශිර්වාද ලබා ලබාගැනීමෙන් අනතුරුව 2015.07.05 වන දින ජය ශ්‍රී මහා බෝ සමිදුන් අභියස බළඇණියට බෝධිපූජාවක් පවත්වා 2015.07.16 වන දින මුලතිව් වට්ටප්පලෙයි ශ්‍රී කන්නනි අම්මාන් කෝවිලේදී විශේෂ පූජාවක් පවත්වා ආශිර්වාද ලබා ගන්නා ලදි.

තවද 2015.07.17 වන දින ස්වාමින් වහන්සේලා දහතුන් නමක් බළඇණිය වෙත වඩම්මවා සර්වරාත්‍රික පිරිත් සජ්ඣායනාවක් පවත්වා බළඇණියට හා එහි සෙවයේ නියුතු සියලුම නිලයින් වෙත ආශිර්වාද ලබා ගන්නා ලදී. 2015.07.23 වන දින අණදෙන නිලධාරී වෙත සම්මාන පෙළපාලියක් පිරිණමන ලද අතර, එදිනම 2015.07.25 වන දින සන්ධ්‍යාවේදි සියලුම නිලයින් වෙනුවෙන් පැවති සුහද සාදය සංගීත ප්‍රසංගයකින් හා මල්වෙඩි සංදර්ශණයකින් වර්ණවත් විය.

හය වන බළඇණි සංවත්සරය සැමරූ ඒකකයේ අණදෙන නිලධාරි ඇතුලු මෙම සංවත්සරය සංවිධානය කළ සියලුම නිලයින්හටත් සිවිල් සේවක මහතුන් වෙතත් අප මෙසේ සුබාශිංශන ගෙන එන්නෙමු.

## පාබල හමුදාවෙන් බිහිවූ
# කරාතේ කළුපටි ශූරයෝ



23 වන ශ්‍රී ලංකා පාබල හමුදා බළඇණිය යටතේ පුහුණුවීම් සිදුකර කෙටි කාලයක් තුළ ඉතා සීඝ්‍ර දියුණුවක් ලබාගත් මෙම කණ්ඩායමේ සෙ/327468 ලාකෝ කුමාර එස්ඒඑම්ඩබ්ලිව්පී සෙ/330701 ලාකෝ ඩිල්ෂාන් ටීඒඑන් හා සෙ/327452 සාසෙ සම්පත් වීටීයූඑන් යන ක්‍රීඩකයින් තිදෙනා 2015 ජාතික කරාතේ ශූරතාවලියේදි කළු පටි කණ්ඩායම් කරාතේ ඉසව්වේ ජාතික ශූරතාවය දිනා ගැනිමට සමත්විය. මෙය මෙම ශූරතාවලියේදි ශ්‍රී ලංකා යුද හමුදා ක්‍රීඩකයින් ලබාගත් එකම රන් පදක්කම වීම විශේෂත්වයකි.

ශ්‍රී ලංකා ෂිතෝරියෝ ෂුකෝකායි කරාතේ සංගමයේ ප්‍රධාන උපදේශක සෙන්සෙයි ලයනල් සපරමාදු හා සෙන්සෙයි වසන්ත සෙනවිරත්න විසින් පුහුණු කරවනු ලබන මෙම රෙම ශ්‍රීලපාහ කරාතේ කණ්ඩායම 23 ශ්‍රීලපාහ අණදෙන නිලධාරි ලුතිතන් කර්නල් එස් විජේසිරිවර්ධන ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ශ්‍රීලපාහගේ සෘජු අධීක්ෂණය යටතේ පුහුණුවීම් සිදු කරනු ලබන අතර, මෙම ක්‍රීඩා ශූරයන් 2015.08.31 වන දින ජපානයේ පැවති 13 වන ආසියාතික කරාතේ ශූරතාවලියට සහභාගී විය.

**බුද්ධි අංශය 23 ශ්‍රීලපාහ**



## Regimental Kitchen Complex

# DECLARED OPEN

# රෙජිමේන්තු මුළුතැන්ගෙය සංකීර්ණය විවෘත වෙයි...



පාබල හමුදා රෙජිමේන්තු පරිශ්‍රයේ  අභිනවයෙන් ඉදිකරන ලද ආහාර පිසීම සඳහා සවිකරණ ලද අති නවීන උපකරණ සහිතව අංග සම්පූර්ණ මුළුතැන්ගෙය 2015 අගෝස්තු මස 08 වන දින රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් කේවීඩීපී කරුණාසේකර ආර්එස්පී යූඑස්පී එන්ඩීයූ පීඑස්සී සුරතින් එදිනට එළඹි සුබ මුහුර්ථයෙන් විවෘත කෙරිණ. මෙම අවස්ථාවට මධ්‍යස්ථාන සේනාවිධායක, නියෝජ්‍ය සේනාවිධායක ඇතුලු ජ්‍යෂ්ඨ නිලධාරීන් රැසක් සමඟින් රෙජිමේන්තු සැරයන් මේජර් ප්‍රමුඛ සෙසුනිලයින් ද සහභාගී වූහ.









# ශ්‍රමදායකත්වය අගයමු



**මේජර් ජෙනරල් ඊඑම්එම් අඹන්පොල යූඑස්පී**
කර්නල් සේනාවිධායක ඉසේබ



**බ්‍රිගේඩියර් ආර්එම් පෙරමුනේ එල්එස්සී**
ව්‍යාපෘති අධ්‍යක්‍ෂක

පෞඩ ඉතිහාසයකට උරුමකම් කියන අප රෙජිමේන්තුවේ එම පෞඩත්වයට හානියක් නොවන අයුරින් මීට වසර ගණනාවකට ඉහතදී ගොඩනගන ලද ගොඩනැගිලි හා මංමාවත් යලිත් ප්‍රතිසංස්කරණය කරමින් මෙම ඉදිකිරීම් කටයුතු යුධ හමුදා මූලස්ථානයේ ඉංජිනේරු සේවා අධ්‍යක්‍ෂක මණ්ඩලයේ පූර්ණ මැදිහත්වීමෙන්, ඉංජිනේරු සේවා රෙජිමේන්තු මධ්‍යස්ථානයේ රෙජිමේන්තු අධිපති තුමන්ගේ මගපෙන්වීම මත පළවන ඉංජිනේරු සේවා රෙජිමේන්තු අණදෙන නිලධාරි තුමන්ගේ අධීක්‍ෂණය යටතේ වැඩ කටයුතු ආරම්භ කෙරිණි. පළවන ඉංජිනේරු සේවා රෙජිමේන්තුවට අයත් මේජර් එච්එම්එස්පී බංඩාර ඉසේරෙ හා ලුතිතන් ඕඩබ්ඩීකේ ඉන්ද්‍රජිත් ඉසේරෙ නිලධාරීන් මෙන්ම ඉසෙ තුෂාර සීආර් හා ඉසෙ නිශාන්ත කේආර් සියලු ඉදිකිරීම් කටයුතු පිළිබඳ අධීක්‍ෂණ කටයුතු සිදු කළ අතර, පළවන ඉංජිනේරු සේවා රෙජිමේන්තුවට අයත් සෙසුනිලයින් 170 දෙනෙකු ශ්‍රම දායකත්වය ලබා දෙන ලදි. හිටපු යුද්ධ හමුදාධිපති ජෙනරල් ආර්එම්ඩී රත්නායක යටතේ මේ සඳහා මූලික පසුබිම සකස් වූ අතර, ඒ සඳහා යුද හමුදා මූලස්ථානයේ පූර්ණ අනුමැතිය හා මූල්‍ය ප්‍රතිපාදන යටතේ මෙම ව්‍යාපෘතීන් නිම කිරීමට හැකි විය.

අද වන විට ශ්‍රී ලංකා පාබල හමුදා රෙජිමේන්තු මධ්‍යස්ථානය නවීකරනය වී අලුතින් ගොඩනැගිලි හා මංමාවත් ඉදි වී සුන්දර පරිසරයක් ගොඩනැගි ඇත. එම පසුබිම සකස් කිරිම සඳහා සුවිශාල දායකත්වයක් ලබාදුන් ඉංජිනේරු සේවා අධ්‍යක්‍ෂක තුමන් ප්‍රමුඛ අධ්‍යක්‍ෂක මණ්ඩලයටත් ඉංජිනේරු සේවා රෙජිමේන්තු මධ්‍යස්ථානයේ රෙජිමේන්තු අධිපති තුමන්, පළවන ඉංජිනේරු සේවා රෙජිමේන්තුවේ අණදෙන නිලධාරි තුමන් ඇතුලු දායකත්වය ලබාදුන් සියලුම නිලධාරි හා සෙසුනිලයන් හට කෘතගුණ දැක්වීම සඳහා මෙය අවස්ථාවක් කරගන්නා අතර, ශ්‍රී ලංකා පාබල හමුදා රෙජිමේන්තු අධිපති තුමන්, සේනාවිධායක තුමන්, සියලුම ජ්‍යෙෂ්ඨ නිලධාරීන්, නිලධාරීන්, ඇතුලු සියලුම නිලයින්ගේ හෘදයාංගම ස්තූතිය මින් පුදකර සිටින්නෙමු.



ලුතිතන් කර්නල්
පීඩීඑච්ඩී විජේනායක



මේජර්
එස්එම්එච්පේ බණ්ඩාර



ලුතිතන්
ඕඩබ්ඩීකේ ඉන්ද්‍රජිත්







# Dear Amal;

It gave me un-measurable pleasure to read in the CDN of last week and later in the SL Army web site the opening of a two story Regimental Corporal's Club building at Panagoda. The pictures were fabulous and told the whole story. I congratulate you on your initiative in bringing the Club to such great heights from humble beginning, probably not known and lost to history. I am glad I lived to this day to review the grand opening.

My happiness goes back fifty four years, to September 61, after I returned from Wellington Staff College and took up appointment as "C" Company Commander of 1/CLI. It was then I mooted the idea of opening a Corporal's Club with my Commanding Officer, Lt Col Richard Udugama. There were objection especially from wartime Warrant Officers and Sergeants. Who forwarded the argument that Lance Corporals and Corporals are the first point of authoritative contact and guidance and a separate club will remove them from close contact with the sections they lead. I had been in command to Major A.R. Udugama at the Army Recruit Training Depot earlier for nearly three years and with his concurrence we opened the First Corporal's Club in the Army at the ARTD. With him as CO 1/CLI these objections were easily overcome and the first Regimental Corporals Club in the army was opened. as I recollect in October of 1961 the club was grudgingly given some space in the front room attached to the Men's Dining Hall facing the road opposite the new war memorial. Colonel Udugama was open to new ideas and supportive of my initiative. Thank God I am alive to tell this bit regimental history for otherwise it will never be known.

I also noted with interest the awarding of scholarships to children of soldiers that day. Are there individual donore or does the money come from regimental funds. What amount would be considered appropriate to set up a scholarship? The idea to participate has touched me and I would liked to be more informed. Though belated, I want to thank you for the genuine expression of regrets at my seating at the farewell dinner to Gen Ratnayake and for the kind sentiments and assurances of so eloquently stated. I heartily appreciate all that was stated.

For purposes of record my new address is 115 Bonis Avenue, Suite 506, Toronto, Ontario, Canada M1T 3S4. Sometime ago I believe I wrote to Brig Weerasuriya regarding medal, ribbons etc but still the matter is unattended. I will to you re my needs in a separate letter. I hear nothing but good news of you and the Regiment. Truly I am glad to live to see the progress and achievements of this renowned regiment. My good wishes to you and all ranks of the Regiment.

Sincerely
Brigadier A.P.R. David (Retired)



2015 අගෝස්තු මස 06 වන දින
තෙවැනි උපන්දිනය සැමරූ
16 (සෙවි) ශ්‍රීලපාහ
සෙ/22ඩි00440 සායස
දිසානායක JAN ගේ
ආදරණීය දියණිය
සනුගි දුලන්සා



2015 අගෝස්තු මස 02 වන දින
දෙවැනි උපන්දිනය සැමරූ
රෙජිමු ශ්‍රීලපාහ
සෙ/311033 බනි 11 ජනක HAL ගේ
ආදරණීය දියණිය
වෙනුලි සහංගා



2014 ඔක්තෝබර් මස 22 වන දින
දෙවැනි උපන්දිනය සැමරූ
රෙජිමු ශ්‍රීලපාහ
සෙ/311033 බනි 11 ජනක HAL ගේ
ආදරණීය පුතණුවන්
සෙනක සේනුග් සසැසර



2015 ජුනි මස 12 වන දින
දෙවැනි උපන්දිනය සැමරූ
10 ශ්‍රීලපාහ
සෙ/316242 කෝප්‍රල් සෙනෙවිරත්න WLGH ගේ
ආදරණීය පුතණුවන්
ඔශාන් දිනිදු සෙනෙවිරත්න



2015 ඔක්තෝබර් මස 09 වන දින
පළමු උපන්දිනය සැමරූ
7 ශ්‍රීලපාහ
සෙ/322212 ලාන්ස් කෝප්‍රල් රාජපක්ෂ ජී ගේ
ආදරණීය දියණිය
ඔනෙත්මි යෙහංසා රාජපක්ෂ



2015 මැයි මස 27 වන දින
දෙවැනි උපන්දිනය සැමරූ
11 ශ්‍රීලපාහ
සෙ/318923 කෝප්‍රල් සමන් කුමාර KMM ගේ
ආදරණීය දියණිය
කාවින්ද්‍යා සත්සරණි



2015 ජුනි මස 20 වන දින
හතරවැනි උපන්දිනය සැමරූ
නි/67210 කපිතාන් HHPA කුමාර ගේ
ආදරණීය දියණිය
ගිත්මි යවිද්‍යා



2015 ජූලි මස 21 වන දින
දෙවන උපන්දිනය සැමරූ
17(සෙවි) ශ්‍රීලපාහ
සෙ/17ඩි00407 සායස විජේරත්න DP ගේ
ආදරණීය දියණිය
ජස්විරා



2015 ජුනි මස 15 වන දින
හතරවන උපන්දිනය සැමරූ
11 ශ්‍රීලපාහ
සෙ/318112 කෝප්‍රල් මහින්දසේන AGMR ගේ
ආදරණීය දියණිය
සංයුක්ති යුමේෂා



2015 සැප්තැම්බර් මස 17 වන දින
තුන්වන උපන්දිනය සැමරූ
8 ශ්‍රීලපාහ
සෙ/315978 කෝප්‍රල් සාලියරත්න HMR ගේ
ආදරණීය දියණිය
සුජානි මේගනා ඉඳුසරණි හේරත්



2015 ජූනි මස 30 වන දින
හතරවන උපන්දිනය සැමරූ
21 ශ්‍රීලපාහ
සායස තුෂාර සම්පත් NMA ගේ
ආදරණීය පුත්
රන්දිව් මෙත්සර



2015 අගෝස්තු මස 25 වන දින
පළමු උපන්දිනය සැමරූ
18 ශ්‍රීලපාහ
සෙ/18ඩි00385 සායස ප්‍රනාන්දු BRS ගේ
ආදරණීය පුත්
උපිවක මිහෝඳ ඉල්සර ප්‍රනාන්දු



2015 අගෝස්තු මස 26 වන දින
නවවන උපන්දිනය සැමරූ
23 ශ්‍රීලපාහ
සෙ/317745 කෝප්‍රල් ප්‍රසන්න කුමාර MW ගේ
ආදරණීය දියණිය
හමිනි කොෂල්‍යා






2015 සැප්තැම්බර් මස 09 වන දින
හතරවන උපන්දිනය සැමරූ
23 ශ්‍රීලපාහ
සෙ/317745 කෝප්‍රල් ප්‍රසන්න කුමාර MW ගේ
ආදරණීය දියණිය
සචිනි කොෂල්‍යා





# දසුනේ හසුන

අවිහිංසක නීති සිඳියි පිහියක් ගෙන — අතට
ලිහිලක් ගෙන සිතනු කොහොම තියෙන කුරිරු — කමට
මිනිසත්කම ගිනියම් කොට මරා දැමු — පවට
තොපි මොක්කුද ලොව දරුණුම රුපුන් නැසූ — අපට

දසුන : අන්තර්ජාලය ඇසුරෙන්
හසුන : මේජර් තරිඳු වීරසිංහ ශ්‍රීලපාහ



# මංගල සීනු

## වාසනාවන්... සුබ මංගලම්.



4 ශ්‍රීලපාහ සෙ/323003
කෝප්‍රල් ඉන්දික ඩබ්එල්ඩී
**2015 අගෝස්තු 06 වන දින**
**නිමාෂා හංසනී මෙනෙවිය සමග**
යුගදිවියට පා තබන ලදී



15 ශ්‍රීලපාහ සෙ/331122
සාසෙ එදිරිසූරිය ඩීකේසී
**2015 ජුනි 15 වන දින**
**නදීෂා රුක්සන්ති මෙනෙවිය සමග**
යුගදිවියට පා තබන ලදී



2 ශ්‍රීලපාහ සෙ/2ඩී03408
ලාකෝ ගොන්සේකා ඩීසීඑම්
**2015 සැප්තැම්බර් 26 වන දින**
**මනෝජි උදේශිකා මෙනවිය සමග හැපී ශාන් හෝටලයේදී**
යුගදිවියට පා තබන ලදී

# ජනක යන්ත්‍ර හා ජල පොම්ප ක්‍රියාකරු පාඨමාලා අංක 06 හදාරා ප්‍රථම ස්ථානය ලබයි

## 18 (සේවා) ශ්‍රීලපාහ පුවත්



**සෙ/18ඩී00740 සාසෙ නිමල් ශාන්ත ආර්එම් 18(සේවා) ශ්‍රීලපාහ**

18(සේවා) ශ්‍රීලපාහ ඒකකයට අයත් සෙ/18ඩී00740 සාසෙ නිමල් ශාන්ත ආර්එම් යන සෙනි 5 වන ඉංජිනේරු සේවා රෙජිමේන්තුව විසින් 2015.03.27 දින සිට 2015.05.25 වන දින දක්වා පවත්වන ලද ජනක යන්ත්‍ර හා ජල පොම්ප ක්‍රියාකරු පාඨමාලා අංක 06 හදාරා ඉන් ප්‍රථම ස්ථානය හිමි කර ගෙන ඇත. එමෙන්ම සේවා ඒකකයන් හා පාබල ඒකකයන් හි රාජකාරි කරනු ලබන සෙනින් 136 දෙනෙකුගේ සහභාගීත්වයෙන් පවත්වන ලද මෙම පාඨමාලාවේ ප්‍රථම ස්ථානය මෙම ඒකකයට අයත් සෙනියෙකු විසින් හිමි කර ගැනීම මෙම ඒකකයටත් සමස්ථයක් වශයෙන් පාබල හමුදා රෙජිමේන්තුවටත් කීර්තියක් අත් කර දීමට සමත් විය.

# අරුත් නිරුත්

## නිවැරදි බස වහරමු



### අංසබාගය

ශරීරයේ අංශයක් අක්‍රියකාරී වීමේ රෝගය අද බොහෝ දෙනකුන් හඳුන්වන්නේ අංසබාගය කියායි. මේ රෝගය සකු බසින් "අංශ බාධ" හෝ "අංශ වධ" නම් වේ. "බාධ" යනු පීඩා අරුත ගනී. (අංශයක් පීඩාවට පත්වීම). "වධ" යනු මළ යන අරුත ගනී. (අංශයක් මැරිලා යන අරුත). සාමාන්‍ය ජනතාව "අංශ බාධ" හෝ "අංශ වධ" යන දෙකෙන් එකක් වත් නො කියා "අංශ භාග" යනුවෙන් කියන්නට පුරුදු වී ඇත.

### අත්හිටවූ සිරදඬුවම්

අත්හිටවූ සිරදඬුවම් ක්‍රමයද බෝහෝ දුරට ඇඟ බැඳීම හා සමාන වූවකි. මෙය අලුත් අදහසකි. අත් හිටවූ සිර දඬුවම් මේ රටේ ක්‍රියාත්මක වන්නට වුයේ මෙයින් දසක තුනකට පමණ පෙර සිට ය.

අත්හිටවූ සිර දඬුවම් ය කියන්නේ චූදිතයකු ගේ වරද ඔප්පු වූ විට එයට සිර දඬුවමක් දිය යුතු නම් එය නියම කොට, එහෙත් වහා ම ක්‍රියාවේ නො යොදවා එක්තරා කාල සීමාවකට එය අත් හිටුවීම ය. උසාවියෙන් නියම කැරෙන ඒ කාල සීමාවේ දී චූදිතයා කිසි වරදක් නොකොට හොඳ කල්ක්‍රියාවෙන් පසු වූවහොත් ඒ දඬුවම එම කාලසීමාව අවසානයේ දී ආහෝසි වන්නේ ය.

අවුරුදු කීපයකට පෙර මේ දඬුවම් ක්‍රමය ඇති කරන ලද්දේ කරුණු කීපයක් නිසා ය. එකක් නම් බන්ධනාගාර පිරී යෑමෙන් ඉඩකඩ අඩුවීම ය.අනෙක් කරුණ නම් පළමු වරට වරදකට අසුවන තැනැත්තකු බන්ධනාගාර ගත නොකොට, ඔහුට යහමඟට යොමුවන්නට අවස්ථාවක් දීම ය. ඇතැම් විට විනිසුරුවන් පළමු වරට, වරදට හසුවන රජයේ සේවකයන්ට මේ දඬුවම දෙන්නේ ඔවුන් ගේ රැකියාව ගැන ද අනුකම්පාවෙනි.

### අත්‍යවශ්‍ය

සමහරු අත්‍යාවශ්‍ය යනුවෙන් ලියති. එය වැරැදියි. නිවැරැදි වදන අත්‍යවශ්‍ය නම් වේ. මෙය තැනෙන්නේ අති+අවශ්‍ය යන දෙක සන්ධි වීමෙනි. අත් + ඉ අවශ්‍ය අත් + ය් + අවශ්‍ය අත්‍යවශ්‍ය යනුවෙන් සිටී. මේ ආකාරයේ සන්ධියේ දී සංස්කෘත රීතිය අනුව 'ඉ' යන්න 'ය්' යන්න බවට හැරෙයි. 'අත්' යන්න 'අත්‍ය' වුයේ ඒ නිසා ය.

__මේ සන්ධි ද විමසා බලන්න.__

අති+අලංකාර : අත්‍යලංකාර නීති+අනුකූල : නීත්‍යනුකූල රීති+අනුකූල : රීත්‍යනුකූල ජති+අනුරාගය : ජාත්‍යනුරාගය
මේ වචන අත්‍යාලංකාර,නීත්‍යානුකූල, රීත්‍යානුකූල, ජාත්‍යානුරාගය යනුවෙන් දීර්ඝ කොට විරූප කැරෙන්නේ ඉහත දැක්වුණු රීතිය නොදත් හෙයිනි.

**ඩීඑෆ් කාරියකරවන මහතාගේ "අරුත් නිරුත්" පොත ඇසුරින්**
**සැකසුම ලාකෝ රත්නකුමාර - ප්‍රකාශන අංශය**



# දියවැඩියාවෙන් වැළකෙමු

අද වන විට දියවැඩියාව කියන රෝගී තත්ත්වය වසංගතයක් බවට පත්වී ඇත. ඉන්දියාව තුළ වෙසෙන සෑම පුද්ගලයින් 5 දෙනෙකුගෙන් එක් අයෙකු දියවැඩියා රෝගයෙන් පෙලෙයි. ලෝකය පුරා වේගයෙන් ව්‍යාප්ත වෙන රෝගී තත්ත්වයන් අතරින් එකක් විදියටද දියවැඩියාව රෝගී තත්වය හදුන්වන්න පුළුවන්. මෙම රෝගයේ ගොදුරක් බවට පත් නොවීමටනම් එහි පූර්ව රෝගලක්ෂණයන් පිලිබදව ඔබ දැන සිටීම ඉතාමත්ම වැදගත් වෙනවා නේද?. එම රෝගී ලක්ෂණයන් හදුනාගත් පසුව ඔබට හැකියාව තිබෙනවා එම ලක්ෂණයන් ස්වාභාවිකවම පහසුවෙන් පරාජය කිරීමට.

## දියවැඩියාවේ පූර්ව ලක්ෂණයන්

දියවැඩියාවේ පූර්ව ලක්ෂණයන් කල්තියා හදුනාගැනීමට තරම් දැනුමක් ඔබට තිබිය යුතු වෙනවා මොකද ඒ මගින් ඔබට හැකියාව ලැබෙනවා දියවැඩියාව කියන රෝගයේ ගොදුරක් බවට පත් නොවීමට.

1. වතුර වැඩි ප්‍රමාණයක් පානය කල පසුවත් පිපාසයක් දැනීම.
2. ප්‍රමාණවත් තරමේ විවේකයක් ලබා ගත්තත් ශරීරයෙන් දුර්වල ස්වභාවයක් දිස්වීම.
3. කිහිප වාරයක්ම නැවත නැවත මුත්‍රා කිරීමේ අවශ්‍යතාවයක් රාත්‍රියේදී ඇති වීම.
4. රාත්‍රියේදී ඇස් පෙනීමේ දුර්වල තාවයක් ඇතිවීම.
5. සමෙහි ඇතිවූ තුවාලයන් සහ ආසාදනයන් සුව වීමට ඉතාමත්ම වැඩි කාලයක් ගත වීම.
6. ලොකු ආහාර වේලක් අනුභව කලත් මිනිත්තු කිහිපයකින් නැවතත් බඩගිනි දැනීම.

## දියවැඩියාවේ රෝග ලක්ෂණයන් ස්වාභාවිකවම පරාජය කිරීම

පූර්ව දියවැඩියා රෝගී තත්වය පරාජය කිරීම සදහා වෛද්‍ය ප්‍රතිකාරයන් වලට යොමුවිය යුතු බව බොහෝ දෙනෙක් ඔබට යෝජනා කර සිටිනවා ඇති. රුධිරයේ ඇති වැඩි සීනි මට්ටම පහත හෙලීම එම ඖෂධයන් මගින් සිදු කරනු ලැබුවත් එය ස්ථිර විසදුමක් නොවෙන බව හොදින් මතක තබා ගන්න. නමුත් ස්ථිරවම දියවැඩියා රෝගී තත්වයේ පූර්ව රෝග ලක්ෂණයන් පරාජය කිරීමට නම් ඔබ කල යුතු වෙන්නේ ශරීරයේ බර අඩු ස්වාභාවිකවම අඩු කරගැනීම සහ සෞඛ්‍ය සම්පන්න ජීවන ක්‍රමයකට හුරු වීමයි.

## දිනපතා ව්‍යායාම කිරීම

දියවැඩියා රෝගී තත්වයේ රෝග පූර්ව ලක්ෂණයන් ඔබගෙන් දිස්වෙනවානම් දිනපතා ව්‍යායාම කිරීම ඉතාමත්ම වැදගත් වෙනවා. මොකද ව්‍යායාම කිරීම හේතුවෙන් ඉතාමත්ම අඩුවශයෙන් තමයි මාංශපේශීන් සදහා (ඉන්සියුලින්) අවශ්‍ය වෙන්නේ. ඒ හේතුවෙන් ඔබට හැකියාව ලැබෙනවා රුධිරයේ සීනි මට්ටම බොහොම පහසුවෙන් සාමාන්‍ය ආකාරයෙන් පවත්වාගෙන යෑමට. ඉතාමත් හොද ප්‍රතිපල ලබාගැනීමට දවසකට මිනිත්තු 30 ක් හෝ 45ක් ව්‍යයමයන්හී නිරත වෙන්න.

## කාබෝහයිඩ්රේට් පරිභෝජනය

දියවැඩියා රෝගී තත්වයේ පූර්ව රෝග ලක්ෂණයන් පරාජය කිරීමට නම් සරල කාබෝහයිඩ්රේට් පරිභෝජනය සීමා කල යුතු වෙනවා. මොකද ඒ මගින් ශරීරයේ ඇති මේදය බිඳ වැටීමක් සිදු වෙන අතර නිදහස් වෙන ශක්තිය පහසුවෙන් මේදය බවට පත්වීමද බිදවැටීමේ ප්‍රවනතාවයක් තිබෙනවා. නමුත් ඔබ සංකීර්ණ කාබෝහයිඩ්රේට් නම් අනුභවකල යුතු වෙනවා. තිරිගු පිටි වලින් සාදන ලද පාන්, රතුබත් සහ තම්බා ගත් අර්තාපල් වල සංකීර්ණ කබෝහයිඩ්රේට් අඩංගු වෙනවා. ඒ වගේම සුදු පාන්, පැණිරස, චොකලට්, බිස්කට් සහ කේක් වර්ගයන් සම්පූර්ණයෙන්ම අනුභාවයෙන් වැලකිය යුතු බව හොදින් මතක තබා ගන්න.

## වැඩි වශයෙන් ජලය පානය කිරීම

දියවැඩියා රෝගයේ එම පූර්ව ලක්ෂණයන් පරාජය කිරීමට නම් ඔබේ ශරීරය සජලනයව තිබිය යුතු වෙනවා. මුත්‍රා කිරීම මගින් ශරීරයේ ඇති විෂ ද්‍රව්‍යයන් පිට වීමටනම් අඩුම තරමේ දවසකට වතුර වීදුරු 8ක් වත් ඔබ පානය කල යුතු වෙනවා.

## තන්තු වලින් පොහොසත් ආහාරයන් අනුභව කිරීම

තන්තු වලින් පොහොසත් ආහාර අනුභවය මගින් රුධිරයේ ඇති සීනි මට්ටම පහත වැටෙන අතර ශරීරයේ බර අඩු වීමක්ද සිදු වෙනවා. ප්‍රමාණවත් තරම් ජලය සමග තන්තු වලින් පොහොසත් ආහාරයන් අනුභව කරනවානම් එම රෝග ලක්ෂණයන් පහසුවෙන්ම පරාජය කිරීමට ඔබට හැකියාව ලැබෙනවා.

## ආතතිය පරාජය කිරීම

දියවැඩියාවේ රෝගලක්ෂණයන් පරාජය කිරීමට නම් ආතති මට්ටම අවම කරගත යුතු වෙනවා. ප්‍රමාණවත් තරමේ නින්දක්, යෝගා ව්‍යායාම සහ භාවනාවන මගින් ශාරීරික සහ මානසික ආතතිය අවම කරගැනීමට හැකියාව තිබෙනවා.

**අන්තර්ජාලය ඇසුරෙන් සැකසුම්**
**ලාකෝ රත්නකුමාර බිකේවන්වන් - වයිට්හැකල් ප්‍රකාශන අංශය**



රෙජිමේන්තු මධ්‍යස්ථානය ශ්‍රී ලංකා පාබල හමුදාව, හා ශ්‍රී ලංකා පාබල හමුදා සේවා වනිතා ශාඛාව එක්ව රණක්ෂයට පත් රණවිරුවන්ගේ රස වින්දනය උදෙසා සංවිධානය කරනු ලැබූ

# මේරියන්ස් සංගීත ප්‍රසංගය 2015

## MARIANS MUSICAL SHOW- 2015

**Organized by Sri Lanka Light Infantry & Seva Vanitha Branch**

රෙජිමේන්තු මධ්‍යස්ථානය ශ්‍රී ලංකා පාබල හමුදාව හා ශ්‍රීලංකා පාබල හමුදා සේවාවනිතා ශාඛාව එක්ව රණක්ෂයට පත් රණවිරුවන් උදෙසා සංවිධානය කරන ලද මේරියන්ස් සංගීත ප්‍රසංගය 2015.09.21 මහරගම තරුණසේවා සභා යොවුන් රඟහලේදී පැවැත්විය. මෙම සංදර්ශනය සඳහා ගෞරවනීය ආරාධනයෙන් ශ්‍රීලංකා යුද්ධ හමුදා මණ්ඩලික ප්‍රධානී මේජර් ජෙනරල් එන්ඒජේසී ඩයස් ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීසී හා පාබල හමුදා රෙජමේන්තු අධිපති මේජර් ජෙනරල් කේඒඩීඒ කරුණාසේකර ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීයූ පීඑස්පී මැතිතුමන්, මධ්‍යස්ථාන සේනාවිධායක බ්‍රිගේඩියර් එම්එම් කිත්සිරි ආර්එස්පී, නියෝජ්‍ය සේනාවිධායක කර්නල් පීඑම්එන් පේරේරා ආර්ඩබ්ලිව්පී ආර්එස්පී සමග නිලධාරීන් සහ සෙසුනිලධීන් සහභාගී වූ අතර, සංගීත රසාස්වාදය ලබාගැනීම සඳහා විශ්‍රාමික ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සමඟින් ආබාධිත රණවිරුවන් විශාල පිරිසක් සහභාගී විය.

තවද මෙම සුයායාමය රසවත් කරමින් කිසිදු මුදලක් අය නොකර මියුරුසර සංගීතය සැපයූ මේරියන්ස් සංගීත කුණ්ඩලයේ නලීන් පෙරේරා ප්‍රමුඛ වාද්‍ය භාණ්ඩයටත්,නිවේදන කටයුතු සිදු කල කැළුම් ශ්‍රීමාල් මහතාටත්, පිජ්සීස් නායක සුනිල් පෙරේරා මහතාටත්. මිහිර සිරිතිලක කලාකරුවාටත් මෙම සංදර්ශනයේ සංවිධායක මණ්ඩලයේ ගෞරවය මෙයින් පුද කරමු.

**වයිට් හැකල් ප්‍රකාශන අංශය**















# බළඇණි පුහුණු පාඨමාලාව හදාරමින්...

## සෙබළාට දියහැකි උතුම්ම දායාදය පුහුණුවයි



**2(සේවා) ශ්‍රීලපාහ පුවත්**

2 වන ස්වේච්ඡා ශ්‍රීලංකා පාබල හමුදා බලඇණියේ රාජකාරි නියුතු නිළධාරීන් සහ සෙසුනිලයින්ගේ දැනුම වර්ධනය කිරීම සඳහා මාවඩිපුරම් බළඇණි පුහුණු පාසලේදී දින 45 ක කාලසීමාවක් ආවරණය වන පරිදි දක්ෂ උපදේශක මඩුල්ලක් යටතේ බළඇණි පුහුණුවීම් සිදුකරන ලදී. අණදෙන නිලධාරි මේජර් පීඩබ්ල්වන්වන්වස්කේ වීරසිංහ ශ්‍රීලපාහ විසින් මෙම පාඨමාලාව අධීක්ෂණය කරන ලදී.



2015 ජූනි මස 09 වන දින 513 බළසේනාධිපති බ්‍රිගේඩියර් එස්පී සෙනෙවිරත්න ආරම්භක දේශණය සිදුකරන ලද අතර, පාඨමාලාව සඳහා වූ සියළුම පාලන කටයුතු මනාව සම්බන්ධීකරණය දෙවන අණදෙන නිළධාරි මේජර් යූඇම්පී උඩුකුමාර ශ්‍රීලපාහ කටයුතු කරන ලදි. පාඨමාලාව අතරතුර කණ්ඩායම් අතර වොලිබෝල් තරඟාවලියක්ද පැවැත්වූ අතර එහිදී සියළු කණ්ඩායම් අභිබවා ජයග්‍රහණය සී කණ්ඩායමට ද, අනුශූරතාවය බී කණ්ඩායම ද ලබාගන්නා ලදී. ක්‍රමවත් කාලසටහනක් යටතේ අභ්‍යන්තර ආරක්ෂක රාජකාරි, අවි පුහුණුව, යුධ උපක්‍රම, ප්‍රායෝගික වෙඩිතැබීම්, කොම්පාසු යන්ත්‍ර පුහුණුව, ශාරීරික යෝග්‍යතා පරීක්ෂණ, ආධාරක අවි පුහුණුවීම්, වන අභ්‍යාස පුහුණු කිරීමෙන් මනා දැනුමක් හටපිරිස් ලබා ගන්නා ලද අතර විද්වත් දේශකයින්ගේ වටිනා දේශණ සඳහා ද සහභාගි වීමට හැකිවිය. පාඨමාලාවේ අවසන් වන අභ්‍යාසයේ නියෝග ලබාදීම 512 බළසේනාධිපති බ්‍රිගේඩියර් ටීජේ කොඩිතුවක්කු ආර්ඩබ්පී ආර්එස්පී යන ජ්‍යෙෂ්ඨ නිලධාරි තුමන් විසින් සිදුකරන ලදී. පාඨමාලාවේ හොඳම කණ්ඩායම වශයෙන් "ඒ" කණ්ඩායමද, පාඨමාලාවේ දක්ෂතම නිළධාරි හා හොඳම සිසුවාට හිමි ස්ථානය කපිතාන් එස්පීඑස්ඒ සෝමසිරි ශ්‍රීලපාහ, දක්ෂතම වෙඩික්කරු කෝප්‍රල් රාජකරුණා ආර්එන්, හොඳම ශාරීරික යෝග්‍යතාවය කෝප්‍රල් අරුණ සිරි ලංකා එස්ඒ, හොඳම ජ්‍යෙකොනොනි ලෙස සැරයන් ජයවර්ධන ඩබ්කේ ද හොඳම පෙල අණදෙන්නා ලෙස කොප්‍රල් අළුගොල්ල එස්ඒ සහ ආධාරක කණ්ඩායමේ දක්ෂතම සෙබළා වශයෙන් සාසෙ සම්පත් ඩබ්එම්සීජේ යන අයවලුන් කර්නල් ඩීඑම්ඒපී දිසානායක ආර්ඩබ්පී ආර්එස්පී අයිජී වෙතින් කුසලාන හිමි කරගන්නා ලදී. මෙම පුහුණු පාසලෙහි මෙතෙක් පැවැත්වූ බලඇණි පුහුණු පාඨමාලා අතරින් අණදෙන නිලධාරීන්ට හිමි සියළුම ලකුණු අභිබවා ලකුණු 87.81% ක ප්‍රතිශතයක් ලබාගෙන වාර්තාවක් තබන්නට ඒකක අණදෙන නිලධාරි සමත් විය.



පාඨමාලාව අවසානයේදී ඒකකය වෙතින් පුහුණුවීම් ලබන සෙබළුන්ගේ සුභසාධනය වෙනුවෙන් පුහුණු පාසල වෙත වටිනා විදුලි මෝටරයක් පරිත්‍යාග කරන ලදී.



සැකසුම:
**කපිතාන් ජේඒ මිහිරශාන්ත ශ්‍රීලපාහ**
**විධායක අධිකාරි - 2(සේවා) ශ්‍රීලපාහ**





## ආසේමු (කිලි) අන්තර් බළඇණි

# යුද ශාරීරික තරඟාවලියේ ශූරයෝ

66 වන සේනාංක මූලස්ථානය වෙතින් සංවිධානය කරනු ලැබූ අන්තර් ඒකක බළඇණි යුද ශාරීරික අභ්‍යාස තරඟාවලිය 2015. ජූනි මස 15 වන දින සිට 2015 ජූනි මස 24 වන දින දක්වා අරසපුරකුලම් පුහුණු පාසලේදී ආරක්ෂක සේනා මූලස්ථානය කිලිනොච්චිය තරඟ විනිශ්චය මඩුල්ලක් හමුවේ පවත්වන ලදී. ඒ සඳහා ආසේමු (කිලි) යටතේ පාලනය වන බළඇණි 33 ක සියලුම නිලයන් ආවරණය වන පරිදි ඒකක අණදෙන නිලධාරීවරුන් ඇතුලුව අන්තර් බළඇණි ශූරතාවය ලබාගැනීමට තරඟවදින ලදී.



තරඟයේදී කිලෝ මීටර් 2.4 දිවීම, සිටප්, ආම්බෙන්ඩින්, කැට් වොක්, මන්කි ලැඩර්, ලෝ බැලන්සින් බාර්, අඩි 06 තාප්පය, අඩි 08 වල සහ කෙලින් කඹය යන ඉසව් වලින් සමන්විත වූ අතර, එම ඉසව් සඳහා එක් අයෙකුට උපරිම ලකුණු 100 බැගින් උපරිම ලකුණු 1000 කට යටත්ව ද, සංයුතියට අනුව අණදෙන නිලධාරීගේ සහභාගීත්වයට ලකුණු 300 ද රෙජිමේන්තු සැරයන් මේජර්ගේ සහභාගීත්වයට ලකුණු 200 ද වශයෙන් සහභාගීත්වයට ලකුණු 500 වශයෙන් මුළු ලකුණු 1500ක් විය.

තරඟය සඳහා සහභාගී වන ලද උප පෙළ අණදෙන්නන් අතුරින් තෙවන ස්ථානය 20 ශ්‍රීලපාහ ඒකකයේ ලාකෝ ඩයස් ඩීකේසීජී යන කොනොනී විසින් හිමිකර ගන්නා ලදී. ඒකක 33ක් නියෝජනය කරමින් දක්ෂතම ඒකක අණදෙන නිලධාරී ශූරතාවය සඳහා අණදෙන නිලධාරීන් ඉදිරිපත් වූ අතර ඒ සියලුම අණදෙන නිලධාරී වරුන් අභිබවමින් ලකුණු 100 යෙන් ලකුණු 96 ක් ලබාගනිමින් 20 ශ්‍රීලපාහ ඒකකයේ අණදෙන නිලධාරී ලුතිතන් කර්නල් අයිපී ජයසිංහ ආර්ඩබ්ලව්පී,ආර්එස්පී ශ්‍රීලපාහ විසින් එහි ශූරතාවය හිමි කරගන්නා ලදී, සහභාගී වූ සියලුම කණ්ඩායම් පරදා 20 ශ්‍රීලපාහ ඒකකය මුළු ලකුණු ප්‍රමාණයෙන් ලකුණු 1478ක් ලබාගනිමින් අන්තර් බළඇණි යුද ශාරීරික සමස්ත තරඟාවලියේ ශූරතාවය හිමිකරගන්නා ලදී.

සමස්ත තරඟාවලියේ ජයග්‍රාහී කණ්ඩායම් සඳහා වූ ත්‍යාග සහ සහතික පත් බෙදාදීමේ සමාප්ති උළෙල 2015.07.25 වන දින ආරක්ෂක සේනා මූලස්ථානය කිළිනොච්චි ආඥාපති මේජර් ජෙනරාල් එස් රණසිංහ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයු පීඑස්සී ගේ ප්‍රධානත්වයෙන් පැවැත් විය. මෙම උත්සවයට 66 සේනාංකාධිපති මේජර් ජෙනරල් ඒපී ද ඉසෙඩ් වික්‍රමරත්න ආර්ඩබ්ලිව්පී එන්ඩීයු පීඑස්සී, 662 බළසේනාධිපති කර්නල් පීඩී සූරියබංඩාර යන ජ්‍යෙෂ්ඨ නිලධාරී ඇතුලු සම්භාවනීය ආරාධිත ජ්‍යෙෂ්ඨ නිලධාරීන් රැසක් සහ කිලිනොච්චිය පොලිස් අධිකාරී කාර්යාලයේ ජ්‍යෙෂ්ඨ පොලිස් නිලධාරී ද සහභාගී වන ලදී.





බුද්ධි අංශය 20 ශ්‍රීලපාහ



# 5th Anniversary

## 25th Battalion of Sri Lanka Light Infantry

## 5 වන සංවත්සරය සැමරූ 25 වන බළඇණිය ශ්‍රී ලංකා පාබල හමුදාව



5 වන බළඇණි සංවත්සර සැමරුම වෙනුවෙන් 2015.09.18 වන දින අණදෙන නිලධාරී මේජර් එම්ටීඅයි ගුණවර්ධන ආර්ඩබ්ලිව්පී පීඩබ්ලිව්සී ප්‍රමුඛ සියලුම නිලයින් පුල්ලෙයාර් කෝවිල වෙත ද, අනතුරුව 2015.09.19 වන දින අනුරාධපුර ශ්‍රී මහ බෝධීන් වහන්සේ අබියස ඒකක ධජයට හා ඒකකයේ දැනට රාජකාරි කරන සියලුම නිලයින්ටත්, යුද්ධයේදී මියගිය, ආබාධිත තත්වයට පත් වූවන්ට සහ සියලුම රණවිරු පවුල්වල ඥාතීන්ට ආශීර්වාද පතා ආගමික වතාවත් සිදු කරන ලදී.



2015.09.20 වන දින අණදෙන නිලධාරී තුමා වෙත සම්මාන මුරයක් පිරිණැමීමෙන් අනතුරුව බළඇණි දින සැමරුමෙහි මතක සටහන් ලෙස එතුමන් විසින් කඳවුරු භූමියේ පැළයක් රෝපණය කරන ලදි. එයට සමගාමීව සෙසු සාමාජිකයින් විසින් කපු පැල 300 ක් මිහිමත සිටුවීමේ උතුම් පාරිසරික මෙහෙවරක් ද සිදුකරන ලදි. අනතුරුව අණදෙන නිලධාරී තුමන් සියලුම නිලයින් ඇමතීමට මොහොතකට පෙරාතුව එතුමන් සුරතින් ඒකකයේ සුදුසුකම් ලත් කොනොනීන් හට නිල පැළඳවීම සිදු කළ අතර, මෙහිදී එක් කොනොනියෙකු සැරයන් නිළයටත්, සැරයන් වරුන් 07 දෙනෙකු වර්ණ සැරයන් නිළයටත් උසස් ලබාදෙන ලදි. පසුව සියලුම නිළයින් සමග දිවා භෝජන සංග්‍රහයක් රස විඳි අණදෙන නිලධාරීතුමන් ඒකකයේ රාජකාරී කරනු ලබන සිවිල් සේවක මහතුන්ගේ අපරිමිත සේවය අගයනු වස් ඔවුන් වෙත ත්‍යාග ලබා දෙන ලදි. 2015.09.21 වන දින සන්ධ්‍යාවේ 22 වන ගජබා රෙජිමේන්තුවේ අඩිරිද්ම සංගීත කණ්ඩායමේ මියරු සත්සර සමගින් එක්වී ඒකකයේ 5 වන සැමරුම වර්ණවත් කළහ මෙම සැමරුම් දිනය ක්‍රමානුකූලව සිදුකිරීම සැළසුම් කළ අණදෙන නිලධාරී තුමන් ප්‍රමුඛ 25 ශ්‍රීලපාහ ඒකකයේ සියලුම නිලයින් හට ශ්‍රීලපාහ රෙජිමේන්තුවෙන් බිහිවූ කීර්තිමත් බළඇණියක් ලෙස ඉදිරියට යන ගමන සාර්ථක වේවායි පතමු.





# ඔබේ සිගරට් බීම නවත්ත ගන්න ඔබත් කැමතිද?

**මේ ප්‍රශ්නයට පිළිතුරු "ඔව්" නම් පමණක් මෙම ලිපි කියවන්න**

ඔව් ☐ නැත ☐

### ඇයි ඔබට තවමත් සිගරට් බිබී ඉන්න වෙලා තියෙන්නේ

සමහරවිට ඔබට හිතෙන්නට පුලුවන් සිගරට් බොන්නෙ පුරුද්දට කියල. නැත්නම් සිගරට් වලට ඇබ්බැහි වෙලා කියල.

ඔව් ඔබ සිගරට් බොන්න පුරුදු වෙලා නැත්නම් ඇබ්බැහි වෙලා වෙන්න පුලුවන්.

### ඇයි ඔබට තවමත් සිගරට් බිබී ඉන්න වෙලා තියෙන්නේ ?

අපි දේකට පුරුදුවෙලා කියල කියන්නෙ, ඒ දේ නැතිවෙනකොට අමාරුවක්, අපහසුවක්, කාන්සියක් දැනෙන එක. උදාහරණයක් විදිහට තේ බීල සිගරට් බොන්න පුරුදු වුන කෙනෙකුට සිගරට් නැතිවුනොත් තේ එකේ ගතිය දැනෙන්නෙ නෑ. සිගරට් බොන්න පුරුදුවෙන්න කලින් හොදට රහට දැනුන තේ එකේ ගතිය දැන් දැනෙන්නෙ තේ එකට අමතරව තව ගාණක් සිගරට්වලට ගෙවන්නත් වෙලා. වෙන විදහකින් කියනවනම් සිගරට් නැතිව තේ එකේ රස දැනෙන්නෙත් නෑ.

### මෙහෙම වෙන එක සැපක් ද ?

මෙහෙම වෙද්දිත් කවුරුහරි කියනව නම් තවදුරටත් සිගරට් බොන එකේ වාසියක් තියෙනව කියල, ඒ සිගරට් කොම්පැණියෙ කෙනෙක් විය යුතුමයි.

### කොහොම කිව්වත් සිගරට් එක බිව්ව වෙලාවට වෙනසක් දැනෙනවා, නැති වෙලාවට අපහසුවක් දැනෙනවා.

ඔව්, ඒ සිගරට් බොන්න පුරුදු වුන කෙනෙක් හැම වෙලාවකම ඉන්නෙ සාමාන්‍ය කෙනෙකුගේ තත්වයට වඩා පහළින්. ඔහු සිගරට් බීමෙන් කරන්නෙ සාමාන්‍ය තත්වයට එන්න උත්සාහ කිරීමක්. අපහසුව දැනුන වෙලාවට සිගරට් එකක බිව්වහම අපහසුව අඩු වුනා. වෙනසක් ඇති වුනා වගේ දැනෙනව තමයි. හැබැයි වෙනසක් වුනා කියල දැණුනට තිබුණු තත්වයට වඩා පහළට ආවා වාගේ දැණුනට තමන් විසින්ම හදාගත් අපහසුව නවත්ව ගන්නයි මේ උත්සාහ කරන්නෙ. සිගරට් බොන අය සිගරට් එකක් බිව්වහම සාමාන්‍ය තත්වයට ආව කියල හිතුවට ඔහුට තවමත් සාමාන්‍ය තත්වයට එන්න බැහැ. හැබැයි සිගරට් එකක් බිව්වහම වෙනසක් දැනෙනවා කියල හිතෙනවා.

### ඉතිං මම සෑහෙන කාලය ඉදල සිගරට් බොනවනේ. දැන් සිගරට් බොන එක නැවැත්තුවට වැඩක් තියෙයි ද ?

අනිවාර්යයෙන්ම සිගරට් බොන එක නවත්තල විනාඩි 20 කින් ප්‍රතිඵල පේන්න ගන්නවා.

**විනාඩි 20කට පසු**
හෘද ස්පන්දන වේගය සහ රුධිර පීඩනය සාමාන්‍ය තත්වයට පත්වේ.

**පැයකට පසු**
සිගරට් ගඳ ඉවත්වීමට පටන් ගනියි

**පැය 8 කට පසු**
අනවශ්‍ය කාබන් මොනොක්සයිඩ් ශරීරයෙන් ඉවතට

**දින 05 කට පසු**
බහුතරයක් නිකොටින් ශරීරයෙන් ඉවතට

# සිගරට් වලින් නිදහස් වීමේ සතුට අත්විඳින්න



**සති 1 කට පසු**
ගඳ, සුවඳ, රස හොඳට දැනෙන් පටන්ගන්නවා

**මාස 1 කට පසු**
නැතිවී ගිය ප්‍රසන්න පෙනුම ක්‍රමයෙන් යථාතත්වයට පත්වේ

**සති 11 කට පසු**
පෙනහළු වලට ඒවා පිරිසිදු කර ගැනීමේ හැකියාව නැවත ලැබෙනවා

**මාස 03 කට පසු**
පෙනහළු ක්‍රියාකාරීත්වය 30% කින් වැඩිවේ

**අවුරුදු 01 කට පසු**
හෘද රෝග අවදානම භාගයකින් අඩුවේ

දිනකට සිගරට් 5ක් බොන කෙනෙකුට අවුරුද්ද අවසානයේ රු. 59,400/= ක ඉතිරියක්

## කොහොමද සිගරට් වලින් නිදහස් වෙන්වෙන්නේ...

*හරිම සරළයි. නවත්වනව කියල හිතුව, නවත්තල දැම්ම*

සමහර අයට එහෙම වෙන්න පුලුවන් එහෙම අයට පහත තිබෙන සරළ පියවරයන් අනුගමනය කරන්න පුලුවන්

**1 පියවර** — **නවත්තන්න දිනයක් යොදාගන්න**

**2 පියවර** — **ඔබගේ තීරණය ක්‍රියාත්මක කිරීමට අන් අය සමග කතා බහ කරන්න**
සිගරට් බොන එක නවත්වන්න යනව කියල විශේෂයෙන් බිරිඳට, පෙම්වතියට, දරුවන්ට සහ යාළුවන්ට කියන්න

**3 පියවර** — **ඉදිරියේ ඇතිවීමට ඇති ගැටළු ගැන සිතන්න**
සිගරට් බොන එක නවත්තන්න යනකොට තවමත් සිගරට් බොන අයගෙන් වෙන්න පුලුවන් බලපෑම් ගැන හිතන්න. විශේෂයෙන් උත්සව අවස්ථාවල හැසිරෙන ආකාරය සැළසුම් කරන්න. එහිදී කළ හැකි දේවල් ගැන යහළුවන් එක්ක කතා කරන්න. උපදෙස් ගන්න. ඔවුන්ගේ සහයෝගය ලබාගන්න

**4 පියවර** — **ඔබේ මෙම තීරණය දුර්වල කරන, සිගරට් බීමට බල කරන කණ්ඩායමට මුහුණ දීමට සූදානම්ම් වන්න**
**උදා:** මම සිගරට් බොන එක නැවැත්තුවා. මට බලකරන්න එපා කියල කියන්න පුරුදු වෙන්න.

**5 පියවර** — **නැවත නැවතත් සිගරට් බීමට ඔබ තුළ ඇති කරන දැඩි ආශාව ගැනත් සිතන්න**
ඔබට නවත්වාගෙන සිටීමේ අපහසුවක් ඇතිවී සිගරට් එකක් බොන්න උනොත් ඒ ගැන පසුතැවෙන්න එපා. සරළව නැවතත් සිගරට් භාවිතය නවත්වන්න.

**6 පියවර** — **සෑම විටම සිගරට් වලින් නිදහස්වීමේ සතුට අත්විඳින්න ඒ ගැන කතා කරන්න**

## විශේෂයෙන් මේ අයගෙන් පරිස්සම් වන්න

ඔබේ උත්සාහයන් අවුල් කරන පුද්ගලයන් සහ විවිධ ප්‍රකාශ පිළිබඳ අවධානයෙන් සිටින්න. මොකද, ඔවුන් ඔබ දියුණු වෙනවාට කැමති නැහැ. කොටින්ම කීවිවොත් ඔබ දියුණු වෙනවාට සතුටින් සිටිනවාට ඔවුන් ඉරිසියයි. එවැනි පුද්ගලයන් ගැන අවධානයෙන් සිටින්න. ඔවුන් පහත සඳහන් ප්‍රකාශ වලින් පහසුවෙන් හඳුනාගන්න පුළුවන්

**" සිගරට් එකක්වත් බොන්නෙ නැත්නම් මොකක්ද ඇති වැඩේ "**
**" සිගරට් නොබී කොහොම නයිට් කරන්න ද "**
**"බලමුකෝ උඹේ බීම නවත්තන හැටි"**
**"උඹ බොන එක නැවැත්තුවේ Wife ට බයේනෙ"**

## මේ සියළු දේ දැන දැනත් තවදුරටත් සිගරට් බිව්වොත් මොකද වෙන්නෙ

- හෘදයාබාධ, පිළිකා හැදීමේ දැඩි අවදානම (සිගරට් බොන දෙදෙනෙකුගෙන් එක් අයෙකු සිගරට් බීම නිසාම මරණයට පත් වේ. එමෙන්ම දිනකට ශ්‍රී ලාංකිකයන් 40 දෙනෙකු සිගරට් බීම නිසා මරණයට පත් වේ.)
- දවසකට ඔබ සිගරට් 5ක් බොනව නම් මාසික වියදම රු. 4,950/= කි. වසරක වියදම රු. 59,400/=කි.
- ලිංගික බෙලහීනතාවය ඇති වේ.
- ඉක්මණින් වයසට යාම සිදුවේ, ප්‍රසන්න පෙනුම නැතිව යයි.
- තේ එකට පස්සෙ, කෑමට පස්සෙ, සිගරට් එකක් නැතිවිට ඇතිවන අපහසුව වැඩි වේ.
- සිගරට් එකක් නැති විට දැනෙන අපහසුව ක්‍රමක්‍රමයෙන් වැඩි වේ.
- තවදුරටත් ආහාරවල රස දැනීම අඩුවේ. සිගරට් එකක් නැතුව වැසිකිළි යිමට ඇති අපහසුව තවදුරටත් වැඩි වේ.

## තීරණය ඔබ සතුයි...

පොතපත ඇසුරින් සැකසුම:
**බනි II දිලුක බීජීඩී ආර්එස්පී**
**වයිට් හැකල් ප්‍රකාශන අංශය ශ්‍රීලපාහ**

# අන්තර් ඒකක මලල ක්‍රීඩා තරගාවලියෙන් 7 ශ්‍රීලපාහට පදක්කම් 3ක්



**සෙ/330984 සාසෙ**
**අනුරසිරි එච්ජී**
මීටර් 3000 බාධක
රිදී පදක්කම



**සෙ/330449**
**ලාකෝ ප්‍රියදර්ශන යුපිචන්කේ**
මීටර් 5000/10000
ලෝකඩ පදක්කම

2015 වර්ෂයේ දියගම මහින්ද රාජපක්‍ෂ ක්‍රීඩාංගනයේ පැවති අන්තර් ඒකක මලල ක්‍රීඩා උළෙලේදී 7 ශ්‍රීලපාහ ඒකකයට අයත් සෙ/330449 ලාකෝ ප්‍රියදර්ශන යුපිචන්කේ යන කොනොනි මීටර් 10000 ඉසව්වේ ලෝකඩ පදක්කම හා මීටර් 5000 ඉසව්වේ ලෝකඩ පදක්කම දිනා දිනාගත් අතර, සෙ/330984 සාසෙ අනුරසිරි එච්ජී යන සෙනි මීටර් 3000 බාධක ඉසව්වේ රිදී පදක්කම දිනා ගනිමින් දක්‍ෂතා දක්වන ලදි. මෙම ක්‍රීඩා උළෙලෙදී රෙම ශ්‍රීලපාහ ඒකක අතුරින් 8 වන ස්ථානය ලබා ගැනීමටද මෙම ඒකකය සමත් විය.

පදක්කම් 3ක් දිනාගනිමින් දක්‍ෂතාවය දැක්වූ මෙම සෙනින්ගේ ක්‍රීඩා කුසලතා තවත් වර්ධනය වේවායි ඒකකයේ අණදෙන නලධාරි අතුලු සැමගේ පැතුමයි.

බුද්ධි අංශය 7 ශ්‍රීලපාහ

# 57 සේනාංකාධිපති ගේ සංචාරය










57 සේනාංකාධිපති බ්‍රිගේඩියර් එච්පේ සෙනෙවිරත්න ආර්ඩබ්ලිව්පී ආර්එස්පී 2015.08.11 වන දින 7 ශ්‍රීලපාහ ඒකකය වෙත කඳවුරු නිරීක්‍ෂණ සංචාරයක නිරත වන ලදී. වදින බළඇණි මූලස්ථානයේ දී පසුකරයෑමේ කඳවුරු මුරයක් පිරිනමා ඉන් අනතුරුව අණදෙන නිලධාරි ලුතිතන් කර්නල් එම්පිඑස්පී කුලසේකර ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ශ්‍රීලපාහ විසින් පිළිගෙන ඒකකය වර්ථමානයේ සිදුකරන ලබන රාජකාරි, ප්‍රජා සත්කාර සේවන් හා විවිධ ව්‍යපෘතීන් පිළිබදව සේනාංකාධිපති තුමන් දැනුවත් කරන ලදි. ඉන් අනතුරුව සියලුම නිලයින් ඇමතීම ද සේනාංකාධිපති විසින් සිදු කරන ලදී. අමුත්තන්ගේ සමරු සටහන් පොතේ සනිටුහන් කර කඳවුරෙන් නික්ම යන ලදි. මෙම අවස්ථාවට 571 බලසේනාධිපති ද සහභාගී විය.

නිවැරදි විසඳුම්පත් 2015 දෙසැම්බර් මස 15 වන දිනට පෙර එවිය යුතුය. තරඟ කූපනය සහ කොන්දේසි මෙහි සඳහන් කර ඇත.

# වයිට් හැකල් 63



## තරඟ කොන්දේසි

1. ප්‍රහේලිකාව පසුපස ඇති අයදුම්පත සම්පූර්ණ කර පහත ලිපිනයට තැපැල් කළ යුතුයි.
2. මෙම තරඟයට වයිට් හැකල් සඟරාවේ කාර්ය මණ්ඩලයට සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින් හට සහභාගි විය නොහැක.
3. පළමුවන, දෙවන හා තුන්වන ජයග්‍රහන හිමිකර ගන්නා ජයග්‍රාහකයින් පිළිවෙළින් රු. 1000/, රු.750/, රු.500/ වශයෙන් මුදලින් තෑගි ලබා දීමට තීරණය කර ඇත.
4. විනිශ්චය මණ්ඩලයේ තීරණ අවසාන තීරණය ලෙස සැලකේ.
5. නිවැරදි පිළිතුරුපත් කුසපත් ඇදීමෙන් තෝරා ගනු ලබන ජයග්‍රාහකයින් තිදෙනෙකු සඳහා පමණක් තෑගි දීම සිදු කෙරේ.
6. පිළිතුරුපත් එවන ලියුම් කවරයේ වම් පස උඩ කෙලවරේ **"වයිට් හැකල් ප්‍රහේලිකා අංක 63"** යනුවෙන් සඳහන් කළ යුතුයි.

ලිපිනය : *වයිට් හැකල් කර්තෘ,*
*වයිට් හැකල් ප්‍රකාශන අංශය,*
*රෙම ශ්‍රීලපාහ, යුද්ධ හමුදා ජනපදය,*
*පනාගොඩ, හෝමාගම.*

1. පිළිමය
5. දසමහා යෝදයින්ගෙන් කෙනෙකි
10. බීම ඇමදීමට ගනී
12 මහනකම් අත්හළ පුද්ගලයා
13. රජතුමා වාසය කරන ස්ථානය
14. ලැබුණි
15. මේවා දීමෙන් මිතුරුකම නැතිවේ
16. නිවස වටා ඇති බිම
18. බුදුන් වැඩි පින් බිමකි
20. ආදරය යන්නෙහි විරුද්ධ පදය
21. ගිහි දිවිය අත්හල අයෙක්
23. විරුද්ධවාදීන් අතර ඇතිවේ
26. අවුල් ජාලාවක් ලෙස ඇති තැනක් මෙසේ හැඳින්වේ
28. ගැටුම්වලට මුල් වන දෙයකි
30. .............. කොළ ගොඩේ හරක් යනවා වගේ
31. විශාල වෘක්ෂයකි
33. නපුරු
34. ජාතක කථාවකි
37. ජීවිත නැසීමට යොදාගනී
38. නඩුවලදී වැදගත් වන චරිතයකි
40. යමෙක සීමාව දැක්වීමට යොදාගන්නා දෙයකි
41. දඬුවම් දීමට යොදාගන්නා දෙයකි
42. ශීත රටවල දැකිය හැකි දෙයක්
43. පුරාණයේ භාවිත කළ මුදල් වර්ගයකි
44. ඇතුළත යන්නට විරුද්ධ පදය
45. ජල මාර්ග හරහා බැඳ ඇති බැම්
47. ජයග්‍රහණය සඳහා මේවා වැඩිපුර ගත යුතුය
48. නගරය නොවේ
50. හදිසියෙන්
52. දැව වර්ගයකි
54. විශාල
55. නරක ගති ඇති පුද්ගලයා
56. ආසියාතික රටකි
57. යුද්ධයෙන් රටවල් ජයගැනීම
58. අලුත්

1. "නැති" යන අරුත ඇත
2. වේදිකාවක ඉදිරියෙන් ඇත
3. ජලයේ වෙසෙන සත්ව විශේෂයකි
4. ගැටළු ඇති කරමින් ඒවායින් ප්‍රයෝජන ගැනීම සාමාන්‍ය ව්‍යවහාරයේ මෙසේ හැඳින්වේ
5. මෙය දෙව්ලොව ඇතැයි කියති
6. නිරිඳා
7. ගෙය
8. මාසය
9. කාන්තාව
10. නපුරු වන සතෙකි
11. ඉතා දීප්තිමත්
17 සපත්තු මල්
19 මිනිරන් හාරනවා, මැණික්..........
20 දෙවී කෙනෙකි
22. තිත්ත බෙහෙතකි
24. ලා දැඹව
25. වාහනය පදවන්නා
27 ගැටගැසීමට අවශ්‍ය වේ
28. මුක්කු
29. මෙය නොහඳුනන මව්පියන් පවා අද සමාජයේ දැකිය හැක
30. ලංකාවේ සිටි සිනමා නිළියකි
32. මොරටුවේදී හමුවෙනවාලු
35. පාරා වළල්ල
36. කඳුපන්තියකි
39. ආබාධිත සෙබළුන් හට නැතිවම බැරි දෙයකි
45. පඩිය
46 බටහිර අප්‍රිකාවේ රටකි
49. මල්සරා
51. පාවෙන වළාකුළු............ සුළඟ
53. පාද දෙකක් ඇති
54. කරඳර

## වයිට්හැකල් ප්‍රහේලිකා අංක 62

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| 3 | 9 | 5 | 4 | 6 | 2 | 7 | 1 | 8 |
| 2 | 1 | 6 | 5 | 8 | 7 | 9 | 3 | 4 |
| 7 | 8 | 4 | 9 | 3 | 1 | 6 | 2 | 5 |
| 8 | 6 | 3 | 7 | 9 | 4 | 1 | 5 | 2 |
| 9 | 2 | 1 | 6 | 5 | 3 | 8 | 4 | 7 |
| 4 | 5 | 7 | 2 | 1 | 8 | 3 | 9 | 6 |
| 6 | 4 | 9 | 1 | 7 | 5 | 2 | 8 | 3 |
| 5 | 7 | 8 | 3 | 2 | 9 | 4 | 6 | 1 |
| 1 | 3 | 2 | 8 | 4 | 6 | 5 | 7 | 9 |

## කූපනය

අංකය: ..............................

නිලය: ..............................

නම: ..............................

..............................

රාජකාරි ලිපිනය : ..............................

..............................

..............................

ඒකකය : ..............................

ජාතික හැඳුනුම්පත් අංකය : ..............................

## මෙවර ජයග්‍රාහකයෝ

**1. ස්ථානය** - නි/69082 ලුතිනන් කේඑ් කරුණාරත්න ශ්‍රීලපාහ 1 ශ්‍රීලපාහ

**2. ස්ථානය** - සෙ/310248 ඛනි 11 අජිත් කුමාර පේඩබ්පී 6 ශ්‍රීලපාහ

**3. ස්ථානය** - සෙ/324810 කෝප්‍රල් ජයලත් ඩබ්ලිව්පීඅයිඑ් 8 ශ්‍රීලපාහ

# පාපන්දු තරගාවලියෙන් 4 ශ්‍රීලපාහ පෙරට....







59 සේනාංකයෙන් සංවිධානය කරන ලද අන්තර් ඒකක පාපන්දු තරඟාවලිය 2015.07.03 දින සිට මුල්ලියාවෙලි සෙන්දමීන් ක්‍රීඩා පිටියේදී පැවැත් විය. ඒකක අණදෙන නිලධාරී ලුතිතන් කර්නල් ජේකේආර්පී ජයසිංහ ආර්ඩබ්පී ආර්එස්පී ශ්‍රීලපාහගේ පූර්ණ අධීක්ෂණය මත මේජර් ඊඑ්එල්සී එදිරිසිංහ ආර්එස්පී ශ්‍රීලපාගේ නායකත්වය යටතේ 16 දෙනකුගෙන් යුත් කණ්ඩායමක් සහභාගි වූ අතර, 59 සේමු යටතේ කණ්ඩායම් 10 ක් අභිබවා ශූරතාවය දිනා ගැනීමට අප ඒකකය සමත් විය. මෙම තරගාවලියේ දක්ෂතම ක්‍රීඩකයා ලෙස ගෝල 26 ලබා ගත් අප ඒකකයේ සෙ/304230 සාසෙ පියදාස එච්ඩබ් සම්මාන යෙන් පිදුම් ලබන ලදී. එළඹෙන ඉදිරි ක්‍රීඩා තරග ඉසව් ජයගෙන ශ්‍රීලපාහ රෙජිමේන්තු නාමය ආසේමු (මු) බළ ප්‍රදේශයේ බැබලවීමට තව තවත් ශක්තිය ධෛර්යය ලැබේවායි ප්‍රාර්ථනා කරමු.

**බුද්ධි අංශය 4 ශ්‍රීලපාහ**

# CHAMPION

Inter Regiment Volleyball Championship - 2015

## වසර 43ක

## දිගු නිහැඬියාව බිඳ රැගෙන ආ

# වොලිබෝල් කිරුළ



## අන්තර් රෙජිමේන්තු වොලිබෝල් තරඟාවලිය 2015

### ශූරතාවය ශ්‍රී ලංකා පාබල හමුදා වොලිබෝල් ශූරයින්ට.....

අන්තර් රෙජිමේන්තු වොලිබෝල් තරඟාවලිය 2015 සඳහා කණ්ඩායම් 18ක් තරඟ කළ අතර, මූලික තරඟ අවසානයේ රෙම ශ්‍රීලපාහ කණ්ඩායම අවසන් මහා තරඟය සඳහා සුදුසුකම් ලැබූහ. අවසන් මහා තරඟය කොළඹ සුගතදාස ගෘහස්ථ ක්‍රීඩාංගනයේදී  පැවති අතර, රෙම ශ්‍රීලපාහ කණ්ඩායම හා ශ්‍රීලයුයුබ කණ්ඩායම අතර තරඟය 2015.09.10 දින පැවැත්වීය. එහිදී ශ්‍රීලපාහ රෙජිමේන්තු කණ්ඩායම 2015 අන්තර් රෙජිමේන්තු වොලිබෝල් ශූරයන් ලෙස අභිෂේක ලැබීය. මෙහි ප්‍රධාන ආරාධිත අමුත්තා වශයෙන් ශ්‍රී ලංකා යුද්ධ හමුදාධිපති ලුතිතන් ජෙනරාල් ඒඩබ්ලිව්ජේසී ද සිල්වා ආර්ඩබ්ලිව්පී යූඑස්පී එන්ඩීයූ පීඑස්සී සහභාගී විය. රෙජිමේන්තු අධිපති ඇතුලු ශ්‍රීලපාහ ජ්‍යෙෂ්ඨ නිලධාරින් හා සෙසුනිලයින් විශාල පිරිසක් මෙම ජයග්‍රාහී අවස්ථාවට සහභාගී වූහ.







### දක්ෂතම පන්දු පිරිණමන්නා සහ තරඟාවලියේ දක්ෂතම ක්‍රීඩකයා

සෙ/ඩී100758 සාසේ සාම කුමාර කේඑම්එස් -14(සෙව්) ශ්‍රීලපාහ

### දක්ෂතම පන්දු සකසන්නා

සෙ/ඩී100745 සාසෙ මාරසිංහ එම්ඒබීඑම් -14(සෙව්) ශ්‍රීලපාහ

ලකුණු 15/12 ක් ලෙස අවසන් වටය ජයග්‍රහනය කරමින් වසර 43 ට පසු වොලිබෝල් කිරුළ නැවත පාබල මෑණියන්ගේ ගෙල පළඳ වූ ශ්‍රීලපාහ ක්‍රිඩකයින්ට රෙජිමේන්තු අධිපතිතුමන් ප්‍රමුඛ සියලුම නිලයින්ගේ උණුසුම් සුභ පැතුම් පිරිණමමු.

සැකසුම - කෝප්‍රල් චන්ද්‍රජීව පීඒඑන් - ක්‍රීඩා අංශය

# වයිට් හැකල්

The White Hackle
JOURNAL OF THE SRI LANKA LIGHT INFANTRY
85th Issue 1994-2015



# WAR HEROES MEMORIAL

## SRI LANKA LIGHT INFANTRY

අපප සමග උරෙන් උර ගැටී සටන්බිමේ පෙරමුණ ගෙන ක්‍රියා කර ප්‍රාන දානයෙන් ඇප කැප වූ පාබල හමුදා නිලධාරින් හා සෙබළුන් සදා අනුස්මරණය කිරීම සඳහා හිටපු යුද්ධ හමුදාධිපති රෙජිමේන්තු අධිපති ලෙසින් කටයුතු කරන අවධියේ එතුමන්ගේ සංකල්පයකට අනුව විශ්‍රාමිකයින් හා සියලුම නිලයින් ගේ ශ්‍රමය හා ධන පරිත්‍යාගයෙන් යුතුව ශ්‍රී ලංකා පාබල හමුදා රෙජිමේන්තු පරිශ්‍රයේ ඉදි වන රණවිරු ස්මාරකය.